29 වන කාණ්ඩය
16 වන කලාපය

සිකුරාදා
1984 අගෝස්තු 10

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නිල වාර්තාව

(අශෝධිත පිටපත)

## අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිලධාරීන්ට විරුද්ධ චෝදනා : කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමාගේ ප්‍රකාශය

පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා :
බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කිරීම

කල් තැබීමේ යෝජනාව

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 29
இல. 16

வெள்ளிக்கிழமை
10 ஓகஸ்ட் 1984

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

அதிகார அறிக்கை

(பிழை திருத்தப்படாதது)

## பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

பெற்றோலியம் கூட்டுத்தாபன உத்தியோகத்தர்க்கெதிரான குற்றச்சாட்டுகள்; கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சரது அறிக்கை

தனியங்கத்தினர் பிரேரணைகள் :
பௌத்த வழிபாட்டுத்தலங்களைப் பாதுகாத்தல்

ஒத்திவைப்புப் பிரேரணை

வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

---

**Volume 29**
**No. 16**

**Friday**
**10th August 1984**

# PARLIAMENTARY DEBATES

**(HANSARD)**

## OFFICIAL REPORT

**(Uncorrected)**

## PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

ALLEGATIONS AGAINST PETROLEUM CORPORATION OFFICIALS: STATEMENT BY THE MINISTER OF INDUSTRIES AND SCIENTIFIC AFFAIRS

PRIVATE MEMBERS' MOTIONS:
Preservation of Buddhist Shrines

ADJOURNMENT MOTION

WRITTEN ANSWERS TO QUESTIONS

2 A 078462 2,750 (84/08)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

**1984 අගෝස්තු 10 වන සිකුරාදා**

**வெள்ளிக்கிழமை 10, ஓகஸ்ட் 1984**

*Friday, 10th August, 1984*

*පූ. භා. 10 ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*பாராளுமன்றம் மு. ப. 10 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 10 a.m.* MR. DEPUTY SPEAKER (MR. NORMAN WAIDYARATNA) *in the Chair.*

---

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
### PAPERS PRESENTED

(1) A Regulation made by the Sri Lanka Tea Board under Section 25 of the Sri Lanka Tea Board Law No. 14 of 1975.

(2) An Order made under Section 2(3) of the Tea (Tax and Control of Export) Act, No. 16 of 1959.–(*Mr. M. Vincent Perera, on behalf of the Minister of Public Administration and Minister of Plantation Industries.*)

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
### வினாக்களுக்கு வாய்மூல விடைகள்
### ORAL ANSWERS TO QUESTIONS

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

Question No. 1.

**ඒ. සී. එස්. හමීඩ් මහතා (විදේශ කටයුතු ඇමතිතුමා)**
**(ஜனாப் ஏ. ஸி. எஸ். ஹமீத் — வெளிநாட்டலுவல்கள் அமைச்சர்)**
(Mr. A. C. S. Hameed–Minister of Foreign Affairs)

I will have this answer ready for the next Sitting which will be on the 23rd of this month.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*

*வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

## පෙත්සම්
### மனுக்கள்
### PETITIONS

**අල්හාජ් එම්. අබ්දුල් බාකීර් මාකාර් මහතා (කාර්ය භාරයක් නොමැති ඇමතිතුමා)**
*(அல்ஹாஜ் எம். அப்துல் பாகிர் மாகார்—அமைச்சு இல்லா அமைச்சர்)*
(Al Haj M. Abdul Bakeer Marker–Minister without Portfolio)

I present a petition from Mr. M. H. M. Siham of No. 5, Sea Road, Weligama dated 20th December, 1983.

**ඩී. වින්සන්ට් ඩයස් මහතා (නියෝජ්‍ය ප්‍රාදේශීය සංවර්ධන ඇමතිතුමා)**
**(திரு. டீ. வின்சன்ட் டயஸ் — பிரதேச அபிவிருத்திப் பிரதி அமைச்சர்)**
(Mr. D. Vincent Dias–Deputy Minister of Regional

I present a petition from Mr. S. A. L. Perera of No. 19, National Houses, Katupelellegama, Badulla dated 19th July, 1984.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*

*மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்ட கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Public Petitions Committee.*

### එම්. පී. ටී. යූ. එස්. වනිගසේකර මහතා : මරණය
### திரு. எம். பீ. ரீ. யு. எஸ். வணிகசேகர : இறப்பு
### MR. M. P. T. U. S. WANIGASEKERA : DEATH

603/84

2. **ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා (ගාල්ල)**
**(கலாநிதி டபிள்யு. தஹநாயக்க — காலி)**
(Dr. W. Dahanayake–Galle)

ජාතික ආරක්ෂාව පිළිබඳ ඇමතිතුමා සහ රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ එම්. පී. ටී. යූ. එස්. වනිගසේකර මහතා 1982 ජූලි 22 වන දින ත්‍රිකුණාමලයේදී ඛේදජනක ලෙස මරණයට පත්වූ බැව් එතුමා දන්නේද ?

(ආ) ඔහුගේ මරණය පිළිබඳව විමර්ශණයක් පවත්වා තිබේද ?

(ඇ) එසේ නම්, එම විමර්ශණවල ප්‍රතිඵල කුමක්ද ?

(ඈ) එසේ විමර්ශනයක් නොමැති නම්, මරණයට හේතුව කුමක් වූයේද ?

(ඉ) දෙමාපියන්ට ලැබුණු වන්දිය කුමක්ද ?

(ඊ) වන්දියක් ලැබී නැත්නම්, ඒ මන්ද ?

*தேசிய பாதுகாப்பு அமைச்சரும், பாதுகாப்புப் பிரதி அமைச்சருமானவரைக் கேட்ட வினா :*

*(அ) இலங்கைக் கடற்படையைச் சேர்ந்த திரு. எம். பீ. ரீ. யு. எஸ். வணிகசேகரா என்பவர் 1982 ஜூலை 22 இல் திருகோணமலையில் பரிதாபமான சூழ்நிலையில் உயிரிழந்தார் என்பதை அவர் அறிவாரா ?*

*(ஆ) இவரது மரணம் தொடர்பில் விசாரணை ஒன்று நிகழ்ந்துள்ளதா ?*

*(இ) நிகழ்ந்திருந்தால் அந்த விசாரணையின் முடிவு என்ன?*

*(ஈ) இல்லாதிருந்தால், அவரது மரணத்துக்கான காரணம் என்ன ?*

*(உ) அவரது பெற்றோருக்கு என்ன நட்டஈடு கொடுக்கப்பட்டது ?*

*(ஊ) இல்லையேல், ஏன் ?*

asked the Minister of National Security and Deputy Minister of Defence :

(*a*) Is he aware that Mr. M. P. T. U. S. Wanigasekera, of the Sri Lanka Navy, met with his death under tragic circumstances on 22nd July, 1982, at Trincomalee ?

(*b*) Has an investigation been held into his death ?

(*c*) If so, what is the result of the investigation ?

(*d*) If not, what was the cause of death ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා]

(*e*) What compensation have the parents received ?

(*f*) If not why ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**

**(திரு. எம். வின்சன்ற் பெரேரா — பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)**

(Mr. M. Vincent Perera–Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

I answer this question on behalf of the Minister of National Security and Deputy Minister of Defence.

(*a*) Yes.

(*b*) Yes.

(*c*) That death was caused by Asphyxia due to drowning during diving practices.

(*d*) Does not arise.

(*e*) There is no provision for payment of compensation as such. The followisng amounts were paid to the parents of the deceased sailor :

(i) Insurance–Rs. 9,976.60

(ii) Death donation by Officers and Sailors–Rs. 4,760.00

(iii) In addition to above a sum of Rs. 1,000.00 from official funds of the Sri Lanka Navy and a death donation of Rs. 1.750.00 by the Officers and Sailors were paid towards the funeral expenses.

(iv) A sum of Rs. 780 per annum plus allowances is also due to be paid to the dependants, under the Navy Pensions and Gratuities Code.

(*f*) Does not arise.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**

**(கலாநிதி டபிள்யு. தஹநாயக்க)**

(Dr. W. Dahanayake)

Is the Hon. Minister aware that there is an allegation that his death was caused not by accident or natural causes but by some sort of assault ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**

**(திரு. எம். வின்சன்ற் பெரேரா)**

(Mr. M. Vincent Perera)

According to the reply (*c*), the death was caused by asphyxia due to drowning during diving practices.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**

**(கலாநிதி டபிள்யு. தஹநாயக்க)**

(Dr. W. Dahanayake)

Is he aware that there is an allegation that death was not due to natural causes ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**

**(திரு. எம். வின்சன்ற் பெரேரா)**

(Mr. M. Vincent Perera)

I want time to inquire into that.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**

**(கலாநிதி டபிள்யு. தஹநாயக்க)**

(Dr. W. Dahanayake)

Will the Hon. Minister please cause investigations to be made into that allegation ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**

**(திரு. எம். வின்சன்ற் பெரேரா)**

(Mr. M. Vincent Perera)

I want time to inquire into that.

## පරාක්‍රම විද්‍යාලය : එකතු කළ අරමුදල්

## *பராக்கிரம வித்தியாலயம் : சேர்க்கப்பட்ட நிதி*

## PARAKRAMA VIDYALAYA : FUNDS COLLECTED

616/83

3. **ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**

**(கலாநிதி டபிள்யு. தஹநாயக்க)**

(Dr. W. Dahanayake)

යොවන කටයුතු හා රැකීරක්ෂා ඇමතිතුමා සහ අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) 1983 නොවැම්බර් මස 8 වෙනි දින අංක 281/83 දරන ප්‍රශ්නයට දෙන ලද පිළිතුර අනුව ඔප්පුවී ඇති චෝදනා මොනවාද ?

(ආ) මේ විදුහල්පතිවරයාට විරුද්ධව ගෙන ඇති ක්‍රියා මාර්ගය කුමක්ද ?

*இளைஞர் விவகாரம், தொழில்வசதி அமைச்சரும் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா :*

*(அ) 1983 நவம்பர் 8 ஆம் திகதி 281/83 இலக்க வினாவுக்கு அளிக்கப்பட்ட விடையின்படி, நிரூபிக்கப்பட்ட குற்றச்சாட்டுகள் எவை ?*

*(ஆ) இந்த அதிபருக்கு எதிராக என்ன நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது ?*

asked the Minister of Youth Affairs and Employment and Minister of Education :

(*a*) With reference to the reply given to Question No. 281/83 of 8th Novermber, 1983, what were the charges that were proved ?

(*b*) What is the action taken against this Principal ?

**ගාමිණී අතුකෝරල මහතා (නියෝජ්‍ය යොවන කටයුතු හා රැකීරක්ෂා ඇමතිතුමා)**

**(திரு. காமினி அத்துக்கோறல — இளைஞர் அலுவல்கள், தொழில் வாய்ப்புப் பிரதி அமைச்சர்)**

(Mr. Gamini Atukorale–Deputy Minister of Youth Affairs & Employment)

(අ) අනාවරණය වූ කරුණු මෙසේ ය :–

ගාල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව

(i) විදුහලේ ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගෙන් ක්‍රීඩා සමිති සාමාජික මුදල් එකතු කිරීම සහ ඒ සඳහා කුවිතාන්සි නිකුත් නොකිරීම ; හා

(ii) විදුහලේ ඩෙස්ක්, පුටු ආදිය අළුත්වැඩියා කිරීම පිණිස මුදල් එකතු කිරීම.

(ආ) ගාල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් විදුහල්පතිට අවවාද කර ඇත.

**නියෝජ්‍ය කථානායකතුමා**

**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**

(Mr. Deputy Speaker)

Question No. 4.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගාමිණී අතුකෝරල මහතා
(திரு. காமினி அத்துக்கோறல)
(Mr. Gamini Atukorale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට මාසයක් පමණ කල් අවශ්‍යයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Time is granted.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ 4 වන ප්‍රශ්නය ගැන වචනයක් කියන්නට මා තමුන්නාන්සේගෙන් අවසර ඉල්ලනවා. මේ ප්‍රශ්නයට කල් දුන්නේ මාස 15 කට පෙරයි. එමෙන්ම මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීම ඉතාමත්ම පහසුයි කියාත් මා කල්පනා කරනවා. මන්ද, ඒ තිබෙන ලිපිගොනුවල පිටපත් ගැනීම පමණයි, පිළිතුරට අවශ්‍ය වන්නේ. ඒ නිසා පිළිතුරු සැපයීම කල්දැමීම අපට පිළිගන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ අවසර දෙනවා නම් තවත් කරුණක් කියන්න මම කැමතියි. මේ විභාගය ගත් අපේක්ෂකයින්ගෙන් හුඟක් පැමිණිලි ලැබුණා ඒ පත්වීම් දුන්නේ ලබාගත් ලකුණු අනුව නොවෙයි කියා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

ප්‍රශ්නයට පිළිතුරු ලැබෙන තුරු හිටියොත් නරකද ?

ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

ඒ චෝදනා අනුව මම මේ ප්‍රශ්නය ඇසුවේ ඒ චෝදනා ඇත්තද බොරුද කියා දැනගැනීම පිණිසයි. මාස 15 ක් ගත වී ඇතත් තවම පිළිතුරක් ලැබී නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

තව මාසයක් කල් ඉල්ලා තිබෙනවා.

රනිල් වික්‍රමසිංහ මහතා (යොවුන් කටයුතු හා රැකීරක්ෂා ඇමතිතුමා සහ අධ්‍යාපන ඇමතිතුමා)
(திரு. ரணில் விக்ரமசிங்ஹ — இளைஞர் அலுவல்கள், தொழில் வாய்ப்பு அமைச்சரும் கல்வி அமைச்சரும்)
(Mr. Ranil Wickremasinghe–Minister of Youth Affairs & Employment and Minister of Education)

Mr. Deputy Speaker, I would like to make a statement in view of the fact that certain allegations have been made. Firstly, to answer this Question we have to obtain data from the Educational Services Committee of the Public Services Commission but they have not yet sent us the relevant data. I made inquiries and they said that there have been appeals made and while many of them have been disposed of, there are a few more to be disposed of and that once they make a final decision the list will be finalized. At that stage I can decide whether I am going to answer the Question or not.

3 A 078462 (84/08)

I would also like the House to be reminded that the responsibility for answering questions lies with the Minister, who is aware of his responsibility to the House. I say so because there have been occasions when remarks have been made from the Chair about the conduct of my Ministry in answering Questions. On an earlier occasion when this question came up, some unwarranted remarks were made. On another occasion–

ලක්ෂ්මන් ජයකොඩි මහතා (අත්තනගල්ල)
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி — அத்தனகல்ல)
(Mr. Lakshman Jayakody–Attanagalla)

Sir, I rise to a Point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order Please. A Point of Order has been raised by the hon. Member. What is your Point of Order ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Sir, there are many occasions when Points of Order have been raised in this House. Here is an occasion where a direct allegation in the form of an insinuation or otherwise has been made with reference to the Chair. I quite appreciate that the Hon. Minister can make a request . . . .

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

What is your Point of Order ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

My Point of Order is that the Hon. Minister cannot make a direct or indirect reference with regard to the Chair.

රනිල් වික්‍රමසිංහ මහතා
(திரு. ரணில் விக்ரமசிங்ஹ)
(Mr. Ranil Wickremasinghe)

All right, Mr. Deputy Speaker, I will withdraw that statement and put it in another way. Certain statements have been made from the Chair regarding my Ministry which I feel does not reflect the proper position. It may be that the Chair may not have been aware of it. There is one principle that has to be followed and that is that the Ministry is responsible. Even in this instance the hon. Member for Galle (Dr. W. Dahanayake) made a statement which was, in fact, a reflection on my Ministry. All that you can do, after a Question is answered, is to ask a supplementary question. If you, Mr. Deputy Speaker, allow the hon. Member to make a statement, then I am also entitled to make a clarification.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රනිල් වික්‍රමසිංහ මහතා]

Quite recently – I was not in the House then – on the advice of the Secretary-General of Parliament, I had to recast an Answer to a Question asked by the hon. Member for Matugama(Mr. Anil Moonesinghe). It may be that the Chair was not aware of the facts but the remark made was that my Deputy Minister had given a lame excuse when, in fact, all the details were known to the Secretary-General.

I thought I should make use of this occasion to clarify my position otherwise the impression is created that the Ministry of Youth Affairs and Employment and the Ministry of Education are not answering Questions. I would not have done even this except for the fact that you gave permission to the hon. Member for Galle to make a statement on why the Question had not been answered.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

Order, please ! The position has now been clarified. A month's time is allowed.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***

*வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

**පී. ඩී. ඊ. අබේවික්‍රම මහතා : විශ්‍රාම වැටුප්**

***திரு. பி. டி. ஈ. அபேவிக்கிரம : ஓய்வூதியம்.***

MR. P. D. E. ABEYWICKREMA : PENSION

164/84

5. **එම්. හලීම් ඉෂාක් මහතා**(මැද කොළඹ තුන්වන)
**(ஜனாப் எம். ஹலீம் இஸாக் — கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)**
(Mr. M. Haleem Ishak–Third Colombo Central)

අග්‍රාමාත්‍යතුමා සහ පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා සහ මහාමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) මහනුවර නගර සභාවේ විදුලිබල මධ්‍යස්ථානයේ විදුලිබල මාර්ග සහ විදුලි බලය බෙදහැරීමේ අංශයේ 1 වැනි ශ්‍රෙණියේ විදුලිබල මාර්ග යාන්ත්‍රික වසයෙන් සේවය කළ පී. ඩී. ඊ. අබේවික්‍රම මහතා 1971. 10. 03 වැනි දින විශ්‍රාම ගිය බව එතුමා දන්නවාද ? (විශ්‍රාම විස්තර : කේ2/5/332 හා 72. 4. 6)

(ආ) ඔහු විශ්‍රාම ගිය අවස්ථාවේදී ඔහුට රු. 574 ක, අඩු විශ්‍රාම වැටුපක් ගෙවා ඇති බවත්, පළාත් පාලන සේවකයින්ට හිමි පස් අවුරුදු දේශගුණික දීමනාව සහ පරිවර්තන විශ්‍රාම වැටුපක් ඔහුට ගෙවා නොමැති බවත් එතුමා දන්නවාද ?

(ඉ) අබේවික්‍රම මහතා විශ්‍රාම ගිය දිනට ඔහුට හිමි සියලු දීමනා සහිත විශ්‍රාම වැටුප එතුමා සඳහන් කරන්නේද ?

(ඊ) අඩු විශ්‍රාම වැටුපක් ගෙවා ඇති අබේවික්‍රම මහතාට හිඟ මුදල් සහිතව සම්පූර්ණ විශ්‍රාම වැටුප් ගෙවීමට එතුමා කටයුතු කරන්නේද ?

(උ) නොඑසේ නම්, ඒ මන්ද ?

*பிரதம அமைச்சரும், உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண அமைச்சரும், பெருவீதிகள் அமைச்சருமானவரைக் கேட்ட வினா :*

*(அ) கண்டி மாநகர சபையின் மின்சக்தி நிலையத்தில் மின் சக்திக் கம்பி விநியோகப் பகுதியில் I ஆம் தர மின் சக்திக் கம்பி இயந்திரவியலாளராகப் பணியாற்றிய திரு. பி. டி. ஈ. அபேவிக்ரம 1971.10.03 ஆந் தேதி இளைப்பாறினார் என்பதை அவர் அறிவாரா ? (இளைப் பாற்றிய விபரம் : கே 2/5/332—72/04/06)*

*(ஆ) இவர் இளைப்பாறிச் சென்ற சந்தர்ப்பத்தில் இவருக்கு ரூபா 574 க்குக் குறைந்த இளைப்பாற்றுச் சம்பளம் வழங்கப்பட்டுள்ளதென்பதையும், உள்ளூராட்சி ஊழியர்களுக்குரிய ஐந்துவருட சுவாத்தியப்படியும் திரட்டிய இளைப்பாற்றுச் சம்பளமும் இவருக்கு வழங்கப் படவில்லையென்பதையும் அவர் அறிவாரா ?*

*(இ) திரு. அபேவிக்ரம இளைப்பாறிய தினத்திலிருந்து இவருக்குரிய எல்லாப் படிகளுடனான இளைப்பாற்றுச் சம்பளத்தை அவர் குறிப்பிடுவாரா ?*

*(ஈ) குறைந்த இளைப்பாற்றுச் சம்பளம் செலுத்தப்பட்டுள்ள திரு. அபேவிக்ரமவுக்கு பாக்கிப் பணத்துடனான மொத்த இளைப்பாற்றுச் சம்பளத்தைச் செலுத்த அவர் நடவடிக்கை எடுப்பாரா ?*

*(உ) இன்றேல், ஏன் ?*

asked the Prime Minister and Minister of Local Government, Housing and Construction and Minister of Highways :

(*a*) Is he awre that Mr. P. D. E. Abeywickrema, who served as a Grade I Power Lines Technician in the Power Lines and Distributional Electricity Division of the Kandy Municipality Power Station, retired on 03.10.1971 (retirement details : K 2/5/322 of 72.4.6) ?

(*b*) Is he aware that he was paid a reduced pension of Rs. 574 on retirement and that he has not been paid the five years climate allowance and the commuted pension due to Local Government employees ?

(*c*) Will he state the pension inclusive of all allowances due to Mr. Abeywickrema on his date of retirement ?

(*d*) Will he take action to pay the full pension with arrears to Mr. Abeywickrema who has been paid a reduced pension ?

(*e*) If not, why ?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
(Mr. M. Vincent Perera)

I answer on behalf of the Hon. Prime Minister and Minister of Local Government, Housing and Construction and Minister of Highways :

(*a*) Yes.

(*b*) At time of retirement he has been awarded a pension of Rs. 574 per annum. However, it was not a reduced pension but a full pension. He has not been paid the five-year climatic allowance and the commuted pension payable to Local Government Service employees. The reason for this was that there was no legal provision at the time of his retirement to pay the five-year

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

climatic allowance and the commuted pension. The Regulations to pay the five-year climatic allowance to Local Government Service employees were implemented with effect from 23.08.1974 while regulations regarding commuted pension have been implemented with effect from 09.01.1976.

(*c*) Rs. 1,810 per annum (basic pension Rs. 574, allowance Rs. 1,236). However, at present the pension inclusive of all allowances paid to this pensioner is Rs. 10,260 per annum.

(*d*) Does not arise in view of (*b*) above.

(*e*) Does not arise in view of (*b*) above.

**ඔයිල් ටැන්කිං ජීඑම්බීඑච්, ඔරෝලියම් (ෆාර් ඊස්ට්) සහ ට්‍රැඩිනාෆ්ට් එස් ඒ : අධ්‍යක්ෂවරුන් ආදීන්**

**ஓயில் ராங்கிங் ஜீஎம்பீஎச், ஒரோலியம் (தூரகிழக்கு) ட்றெடிநூவற் எஸ்ஏ : பணிப்பாளர் ஆதியன**

## OIL TANKING GMBH, OROLEUM (FAR EAST) AND TRADINAFT SA : DIRECTORS ETC.

181/84

6\. **ලක්ෂ්මන් ජයකොඩි මහතා (අත්තනගල්ල)**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி — அத்தனகல்ல)**
(Mr. Lakshman Jayakody–Attanagalla)

කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) මෙහි පහත සඳහන් සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ හෝ හවුල්කරුවන්ගේ නම් සහ ලිපිනයන් එතුමා සඳහන් කරන්නේද ?

(i) බටහිර ජර්මනියේ ඔයිල් ටැන්කිං ජීඑම්බීඑච්.

(ii) ශ්‍රී ලංකාවේ, ඔරෝලියම් (ෆාර් ඊස්ට්) ඔෆ් සිංගපෝර් ප්‍රයිවට් ලිමිටඩ්.

(iii) ස්විට්සර්ලන්තයේ, ට්‍රැඩිනාෆ්ට් ඔෆ් එස්ඒ.

(ආ) ඉහත සඳහන් එක් එක් සමාගමට අදාළව, මෙහි පහත සඳහන් විස්තර සපයන්නේද ?

(i) හිමි කොටස්

(ii) හවුල් හෝ ඒකාබද්ධ ව්‍යාපාරවල හිමි කොටස්

(iii) අනුමත කළ ප්‍රාග්ධනය හා ගෙවා නිමකළ ප්‍රාග්ධනය

(ඇ) මෙම සමාගම්වල ඒ ඒ කොටස්වල හිමිකම් පිළිබඳව ඔවුන් සතුව ඇති සහතික කවරේද ?

கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) பின்வரும் கம்பனிகளின் பணிப்பாளர்கள் அல்லது பங்காளர்களது பெயர்களையும் முகவரிகளையும் கூறுவாரா ?

(i) மேற்கு ஜேர்மனியின் ஓயில் ராங்கிங் ஜீஎம்பீஎச் கம்பனி ;

(ii) இலங்கை, ஒரோலியம் (தூரகிழக்கு) சிங்கப்பூர் பிறைவேட் லிமிட்டெட் ;

(iii) சுவிற்செலந்தின் ட்றேடிநூவற் எஸ்ஏ ;

(ஆ) மேற்குறிப்பிட்ட கம்பனி ஒவ்வொன்றினதும் தொடர்பில் பின்வரும் விபரங்களைத் தருவாரா :—

(i) பங்குடைமைகள் ;

(ii) கூட்டு முயற்சியில் அல்லது இணைந்த முயற்சியில் உள்ள பங்குடைமைகள் ;

(iii) அதிகாரமளிக்கப்பட்ட மூலதனமும் செலுத்தப்பட்ட மூலதனமும் ?

(இ) கம்பனிகளில் இவர்கள் வைத்திருக்கும் ஒவ்வொரு பங்கிற்குமான சான்றுகள் எவை ?

asked the Minister of Industries and Scientific Affairs :

(*a*) Will he state the names and addresses of the directors or partners of the following companies :

(i) Oil Tanking GMBH of West Germany ;

(ii) Oroleum (Far East) of Singapore Private Ltd., of Sri Lanka, and

(iii) Tradinaft of SA of Switzerland ?

(*b*) Will he give the following particulars in respect of each of the companies mentioned above :

(i) share holdings ;

(ii) share holdings in the collaboration or joint venture ;

(iii) authorised capital and paid up capital ?

(*c*) What are the credentials of each share holding in the companies ?

**සිරිල් මැතිව් මහතා (කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමා)**
**(திரு. சிறில் மத்திவ் — கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)**
(Mr. Cyril Mathew–Minister of Industries & Scientific Affairs)

This is a question relating to the Petroleum Corporation. It is a fairly long Answer. I request your permission *to table it.

At the same time I like to mention that yesterday the Member for Attanagalla made certain allegations against certain unnamed people of the Petroleum Corporation. I would like to say that if he wants to make an allegation–

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please ! You are making a statement on that, I believe.

**සිරිල් මැතිව් මහතා**
**(திரு. சிறில் மத்திவ்)**
(Mr. Cyril Mathew)

Yes.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

There is a time for it, and that is after Question time.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Let him make a statement, Sir. We will ask for a debate.

*සභාමේසය මත තබන ලද පිළිතුර :
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled :*

(a) (i) The only 100 per cent shareholder of OIL TANKING is STUMM GMBH, HAMBURG.

The Managing Directors of OIL TANKING GMBH are :–

Messrs EDMUND LANGE & DIRK W. DUNDORP.

The managing Directors of STUMM GMBH are –

Messrs HELMUTH WEISSER, HANS WEISSER & JOACHIM DRINKMANN.

The shares of STUMM GMBH are 100 per cent owned by MARQUART-BAHLS GESELLSCHAFT MIT BESCHARAENKTER HAFTUNG & CO.

(ii) There is no company registered in Sri Lanka called Oroleum (Far East) Pvt Ltd. of Singapore. I believe the hon. Member is seeking details of Oroleum (Far EAst) Pvt Ltd. of Singapore, one of the foreign investors in the Trincomalee Tank Farm Project.

The Directors of Oroleum (Far East) Pte Ltd. Singapore are :

DOUGLAS HENRY MILLER
DORIS BRUNILDA MILLER
JOHN YOUNG
NGIAM TEE-CHIANG
SENERATH DE SILVA
WEE TAI SECK
LIM PENG YOUNG

The only Shareholder of Oroleum (Far East) Pte Ltd. Singapore is Oroleum Ltd. Bermuda.

The Directors of Oroleum Ltd. Bermuda are :

J. DOUGLAS ROBINSON
JOAN HOSKINS
TIMOTHY SKINNER

The main shareholders of Oroleum Ltd, Bermuda, include Miller/Escobar Family Trust and Mr. D. H. Miller.

Other shareholders of OROLEUM LTD., Bermuda, include Singapore, Indonesia, South Korea and Taiwan business interests.

(iii) TRADINAFT SA of Switzerland is a wholly-owned subsidiary of Gulf International Holdings SA of Luxembourg.

The Directors of Gulf International Holdings SA (GIH) are :

Messrs ABBAS K. GOKAL, CHAIRMAN
A. KHALIQ CHAGLA, DIRECTOR
DR. S. A. KUBBA, DIRECTOR

(*b*) (i) It is not clear whether the hon. Member requires the names of the parties who hold shares in each one of the foreign investors, namely Oil Tanking, Oroleum and Tradinaft or the shareholdings each of these companies hold in other companies.

(ii) It is not clear whether the hon. Member wishes to know the shareholdings of each one of these three foreign investors among themselves, or in a collaboration, or in joint venture arrangements among themselves, or whether the reference is to the joint venture company that is to be floated in Sri Lanka to handle the Trincomalee Tank Farm Project. We are not aware of any shareholding arrangements in joint ventures among these three foreign investors or any two of them except that we were informed that at some point of time that Oroleum (Far East) Pte Ltd. of Singapore and Tradinaft SA had a joint venture arrangement based on an equal profit/loss sharing basis. We have also been advised that these two companies are no longer trading on a joint venture basis.

If the reference is to the shareholding in the join venture arrangements to operate the Trincomalee Tank Farm, so far the position is that CPC will hold 16% of the shares and the 3 foreign investors will hold 84% of the shares. Except to state that it is likely that Oil Tanking GMBH will be the major shareholder, we cannot at the moment say the exact shareholdings each one of the foreign investors will acquire in the local joint venture.

(iii) *Tradinaft SA* was incorporated in Geneva in April 1981 with a fully paid up capital of Swiss Francs 10 Million. It is a wholly-owned subsidiary of Gulf Internatinal Holdings the subscribed capital of which as at 31.3.82 is US $ 100 Million.

*Oil Tanking Gmbh* had a fully paid-up capital of German Marks 20,000,000 as at 31.12.1981.

It is a wholly-owned subsidiary of Stumm Gmbh.

Oroleum (Far East) Pte Ltd. Singapore is a wholly-owned subsidiary of Oroleum Ltd., Bermuda. It has a fully paid-up capital of Singapore Dollars 100,000.

(*c*) This question is not understood. If the reference is to the Sri Lanka Company to be formed and the share certificates to be issued, the Sri Lanka company has not yet been formed and the share cerificates have not yet been issued.

## ගම් උදා ප්‍රදර්ශනය : ගරු අග්‍රාමාත්‍යතුමාගේ ආරම්භක කථාව
## கிராமோதயக் கண்காட்சி : பிரதம அமைச்சரின் தொடக்கவுரை
## GAM UDAWA EXHIBITION : INAUGURAL SPEECH BY HON. PRIME MINISTER

185/84

8. ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

රාජ්‍ය ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) අග්‍රාමාත්‍යතුමා විසින් ගම් උදා ප්‍රදර්ශනය විවෘත කරමින් 23.06.1984 දින අනුරාධපුරයේදී කරන ලද කථාව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් ප්‍රචාරය කරන ලද බව එතුමා දන්නවාද ?

(ආ) එම සම්පූර්ණ කථාව සභාගත කරනවාද ?

*இராஜாங்க அமைச்சரைக் கேட்ட வினா :*

*(அ) பிரதம அமைச்சர் அநுராதபுரத்தில் 23.06.1984 ஆந் தேதி, கிராமோதயக் கண்காட்சியைத் திறந்து*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපි ගැන විශ්වාසයක් ඇති කර ගන්න අපි උත්සාහ කරන්න ඕනෑ. ඒ විශ්වාසය ජනිත කර ගන්න පරිසරය ඉතාමත් අවශ්‍යයි. අද බලන්ඩ පරිසරය ගැන. අපේ සැලකිල්ල කොයිතරම් මද වශයෙන් පවතිනවද කියල. අපි ගස් කොලන් කපාගෙන යනව. කිසිම සැලකිල්ලක් නැතිව. හරියට අපි ගස් කොලන් කපාගෙන යන ආකාරය දකින්නෙ අපේ බෙලි අපිම කපාගන්නව වාගේ. ගහකින් තිබෙන ප්‍රයෝජන කොයිතරම්ද කියල අපි අවබෝධ කරගෙන තියෙන්ඩ ඕනෑ. සමහරු මේක තේරුම් ගන්නේ නැහැ.

අපි එක අතකින් කෘෂිකර්ම සංවර්ධන වැඩ පිළිවෙලක් ගෙන යනව. ධාන්‍ය නිෂ්පාදනය. අපේ කෘෂිකර්ම සංවර්ධන වැඩ පිළිවෙල සාර්ථක වුනාම ඒ ධාන්‍ය නිෂ්පාදනය අපේ ආහාර ප්‍රශ්නය විසඳා ගන්නට ප්‍රයෝජන වෙනව. නමුත් ධාන්‍ය අමුවෙන් කන්ඩ පුලුවන්යැ. ධාන්‍ය උයාගෙන කන්ඩ එපායැ. උයාගෙන කන්ඩ ලිප ගිනි මොලවන්ඩ එපායැ. ලිප ගිනි මොලවන්ඩ දර එපායැ. දර කපාගන්ඩ ගස් එපායැ. අන්න ඒක එක පැත්තක්. ගෙවල් හදන්ඩ දැව ඕනෑනෙ. දැව ගන්නෙ කොහොමද ? ඒකට ගස් ඕනෑ. මම එකම කාරණයක් මෙහි සඳහන් කරනව. මේ පරිසරය කොයිතරම් අපට හිතවත්ව තිබිය යුතුද කියල මේ ගස්කොලන් වලින් ලැබෙන්නාවූ ආශ්වාදය, ආශිර්වාදය, කොයිතරම්ද ? අද විද්‍යාඥයෝ සොයාගෙන තිබෙනව ' එයාර් කන්ඩිෂන් ' යන්ත්‍ර පහකින් ශීත සමීකරණ යන්ත්‍ර පහකින් ලැබෙන ඒ පවිත්‍ර වාතය එක ගහකින් ලබාගන්ට පුලුවන්. ඔය දෙහි අත්තෙන් මතුරන්නෙ. ඔය අඹකොල අත්තෙන් ආශිර්වාද කරන්නෙ. ගස් තමයි මිනිසාට ඉන්න පරම මිතුරා. නමුත් ගසට ඉන්න පරම හතුරා මිනිසාම බව තමුන්නාන්සේලා පිළිගන්නවා ඇති.

ඒ නිසා මේ නිවාස දසලක්ෂය වැඩපිළිවෙල තුලට අපි ඇතුලත් කරල තිබෙනව ගස් ලක්ෂ 1,000'ක්. ගස් ලක්ෂ 1,000 ක් වැවීමේ වැඩපිළිවෙලක්. හැම ගෙයක් වෙනුවෙන්ම අඩු ගණනේ ගස් 10 ක් වත් ඉදි කරන්නට පැල කරන්නට නඩත්තු කරන්නට වගා කරන්නට අපි අධිෂ්ඨානයක් ඇති කර ගනිමු කියල මම තමුන්නාන්සේලාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනව. ඒ අධිෂ්ඨානය අද ඇති කරගෙන අපි අපේ ගෙවල් දෙරවල් වලට ගියාම දූ දරුවන්, අපේ නෑදයින් මිත්‍රයන්ට කියල මගේ ජිවිතයේදී අඩු ගණනේ ගස් 10 ක් වත් හදල ඒක මම නඩත්තු කරනවාය කියන අධිෂ්ඨානය ඇති කරවන්න. ඒක කරන්න පුලුවන් හිතට ගත්තොත්.

අපි අද එක්රැස් වී සිටින මේ ඓතිහාසික ශුද්ධ නගරය ගැන මීට කලින් ප්‍රකාශ වුණා. පණ්ඩුකාභය රජතුමා ගැනත් කියවුණා. එතුමා තමයි අපේ රටේ ශ්‍රේෂ්ඨ නගර නිර්මාණ රාජකීය උත්තමයා. එතුමාගේ කාලෙ සංවර්ධන ඉදිකිරීම් අතින් අපේ රට ඉතිහාසගතයි. දේවානම්පියතිස්ස රජතුමා අපේ ජාතිය ශීලාචාර කිරීමේ ව්‍යාපාරයේ පුරෝගාමිත්වය දැරුවා. ඉන්දියාවේ ධර්මාශෝක රජතුමා සමඟ ඇතිකර ගත්ත මිත්‍රත්වය නිසා ධර්මාශෝක රජතුමාගෙන් අපට ලැබිච්ච දායාදය තමයි, සම්බුද්ධ ධර්මය. දේවානම්පියතිස්ස රජතුමාගේ කාලයේ ආරම්භ වෙච්ච ඒ අධ්‍යාත්මික බලවේගය යුගයෙන් යුගය ඉදිරියට යවන්න මේ අනුරාධපුරය මහ පිටුවහලක් වුණා.

දුටුගැමුණු රජතුමා අපට කිසිසේත් අමතක කරන්න බැහැ. විශේෂයෙන්ම මේ කාලේ. එදත් මේ රටේ කොටස් කැඩී අපි වෙන් වී ජිවත් වුණු අවධියේ දුටුගැමුණු රජතුමා තමයි මේ රට එක්සේසත් කලේ. එතුමා ජාතිවාදී සටනක් තුලින් නෙවෙයි, ඒ එක්සත් භාවය ඇති කලේ. එතුමා ජාතිවාදී සටනක් තුලින් නොවෙයි. ඒ එක්සත් භාවය ඇති කලේ. සමහර උදවිය නොයෙකුත් අර්ථ කථන දෙනව. එතුමාගේ වැඩපිළිවෙලට තමුන් ඉතිහාසයේ සොයාබැලුවොත් පෙනෙයි, ජාතිභේද වාදී ව්‍යායාමයක එතුමා නිරත නුන බව. එතුමා සමග ද්‍රවිඩ උදවිය ක්‍රියා කලා. එළාර සමග සිංහල උදවිය ක්‍රියා කලා. එසේනම් එය ජාතිභේද වාදී වැඩපිළිවෙලක් නෙවෙයි. එතුමාට ඕනෑ කලේ මේ රටේ ඒකීය භාවය ඇති කොට සමෘද්ධියක් ඇති කරන්නට.

මහා පරාක්‍රමබාහු රජතුමා තමුන්නාන්සේලා දන්නව. මේරට ස්වයංපෝෂිත කලා. ඔය විදිහට මේ අනුරාධපුරයේ අනෙකුත් යුග ගැන කල්පනා කර බැලුවොත් ආර්ථික වශයෙන්, අධ්‍යාත්මික වශයෙන්, සාහිත්‍ය කලා ශිල්ප වශයෙන් මේ ජාතිය, මේ ජනතාව මේ රට පෝෂණය කිරීමට මේ පිං බිම මේ ශුද්ධ භූමිය පිටුවහල් වුණ බව. අපි මේ භූමිය නමස්කාර පූර්වකව සිහිපත් කරමු.

මට හැඟුණා ගිය වර්ෂයේ තිකවැරටියේදී උදාගම් ව්‍යාපාරයේ පස්වෙනි ජයන්තිය පවත්වන වෙලාවේ මේ සයවෙනි ජයන්තිය අනුරාධපුරයේ පැවැත්විය යුතුය කියල. එය බාහිර යෝජනාවකට වඩා මගේ හදවත තුලින් මගේ හෘද සාක්ෂියෙන් පැණ නැගුණ අදහසක් වුණා. මට ඒ නිසා ඒ වගේම මගේ හෘද සාක්ෂිය කියනවා මේ වර්ෂය අවසාන වන්නට කලින් මේ රටේ තිබෙන උවදුරු, අසමගිය, අසාධාරණය, අසංවරය ක්‍රමානුකූලව නැති වී භාග්‍ය සම්පන්න යුගයක් උදා වෙනවා වෙනවාමයි යන විශ්වාසය මා තුල ඇති වෙනවා. සියලු පාක්ෂික සම්මේලනය පමණක් නොව ඊටත් වඩා සර්ව සාමයික සංවිධානයක් අපේ ඉදිරි ගමනට ඒ සෞභාග්‍ය සම්පන්න යුගය උදා කිරීමට හේතු වෙනවා.

මම ආයාචනය කරනවා, නමස්කාර පූර්වකව ඉල්ලා සිටිනවා. අපේ සුපේෂල ශික්ෂාකාමී ගරුතර මහා සංඝ රත්නයෙන්, අනෙකුත් ආගමික පූජ්‍යයන් වහන්සේලාගෙන්. ඔබ වහන්සේලාට පුලුවන් අර හිතට නිවන ලබා දෙන්න. ඔබ වහන්සේලාට ඔබ වහන්සේලාගේ ප්‍රදේශ වල අපේ මිනිසුන්ගේ සිත් සතන් තුල දැවෙන මේ ගින්න නිවාලන්නට. ඔබ වහන්සේලාටත් ධර්ම මාර්ග අනුව සිහිල් පැන් ඉහින්න. මිනිසුන්ට බාහිරව ඇවිලෙන ගිනි නිවාලන්නට, ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ රජයේ අපි භාර ගන්න බව නමස්කාර පූර්වකව අපේ පූජකයන් වහන්සේලාට මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

සහෝදර සහෝදරයනි, අපට එසේනම් උවමනා කරන්නේ පණ්ඩුකාභය රජතුමා විසින් ආරම්භ කල මේ රට ඒ ආර්ථික නව උන්නතිය දුටුගැමුණු රජතුමා ආරම්භ කල ස්ථාපිත ඒකීය භාවය පරාක්‍රමබාහු රජතුමා ඇති කල ඒ කෘෂි සංවර්ධන ව්‍යායාමය ජීවගේම අපේ වෙනස් ශ්‍රේෂ්ඨ රජදරුවන් විසින් කලා ශිල්පය ආදියේ නව උන්නතියක් ඇති කල ඒ යුග වල සාර ධර්ම මේ යුගයේදී මේ රටේ ජනතාවට භුක්ති විඳීමට අවකාශ සලසා දීම බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට කැමතියි.

මේ වේදිකාවෙන් කියවුනා අද රටේ ඇති වී තිබෙන ත්‍රස්තවාදී සහ වෙනත් උවදුරු සම්බන්ධව භාෂාවට වෙලා තිබෙන අසාධාරණය උඩ අධ්‍යාපනික වශයෙන් ලැබෙනවනම් අසාධාරණයක් රැකියාව අතින් ඔය ආදී අංශ සම්බන්ධයෙන් අසාධාරණයක් වී තිබෙනවානම් ඒ නිසා අපි මේ ත්‍රස්තවාදී වැඩ වලට පෙලඹුනෙ කියා කියනවානම් සහෝදර සහෝදරියනි, එසේනම් සියලු පාක්ෂිකයින් එකට එකතු වී එයට විසඳුම් සොයන්නට සූදානම් වන විට යුතුකමක් තිබෙනවා නේද අර විදියේ හැදීමකින් පෙලඹෙන උදවිය අවි ආයුධ බිම තබන්න. නමුත් ඒක සිදු වී නැහැ. ඒකෙන් මොකක්ද වැටහෙන්නෙ ? මේ ත්‍රස්තවාදී පරමාර්ථයනම් මේ රට විනාශ කිරීමේ පරමාර්ථයයි. අපි ඊට ඉඩ දෙනවද ? මෙවැනි අවස්ථාවක් මේ රටේ ඉතිහාසයේ නොයෙක් වර ඇති වුනා. ඒ අවස්ථාවන් වල අපේ නායකයින්, අපේ විරවරයින් බිය වී නිවට වී එයට මුහුණ නොදී සිටියේ නැහැ. ධෛර්ය සම්පන්නව අභීතව ඒවාට මුහුණ දුන්නා. අන්න ඒ ධෛර්යය අප තුලත් ඇති කර ගැනීමට ක්‍රියා කරන මෙන් මා මේ අවස්ථාවේදී ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ත්‍රස්තවාදීන් අද ප්‍රකාශ කර තිබෙනවා, ඔවුන්ගේ මේ දුෂ්ඨ ව්‍යාපාරය සමථයකට පත් කරන්නට වචන හුවමාරුවකින් පුලුවන් කමක් නැත. වෙඩි උණ්ඩ හුවමාරුවකින් පමණක්ය එය විසඳෙන්නෙ කියල. සහෝදර සහෝදරියනි, මේ ගැන අපි කණගාටු විය යුතු අතර අපි තමුන්නාන්සේලා වෙඩි උණ්ඩ ගැන විශ්වාසය තබන අය නොවෙයි. අවි ආයුධ ගැන විශ්වාසය තබන අය නොවෙයි. බලපුලුවන්කාරකම් ගැන විශ්වාසය තබන අය නොවෙයි. අපි අධ්‍යාත්මික ශක්තිය ගැන විශ්වාසය තබන අය. ඒ විශ්වාසය කවදාවත් අත්හරින්න එපා. මේ තර්ජනයෙන් අපට ජයග්‍රහණය කරන්නට පුලුවන් එකම ක්‍රමය අපේ අධ්‍යාත්මික බලය වැඩිදියුණු කරගැනීමෙන් බව මම නැවත නැවතත් තමුන්නාන්සේලාට ප්‍රකාශ කරන්නට කැමතියි.

අර වෙඩි උණ්ඩ මගින් ඔවුන්ගේ පරමාර්ථය ඉටුකරනවාය කියන උදවිය ප්‍රකාශ කර තිබෙන්නේ ඒ ගොල්ලන්ට උවමනා කරන්නේ මේ රටේ අලුත් සමාජ රටාවක් ඇති කරන්නට. මොකක්ද ඒ සමාජ රටාව. මාක්ස්වාදීය ආකල්පය ඇති සමාජ රටාවක් ඇති කරන්න. මම ඒ උදවියට පිළිතුරු වශයෙන් කියන්න කැමතියි ඕනෑම ආකල්පයක සමාජ රටාවක් ඇතිකර ගන්නට කිසි වරදක් නෑ. හැබැයි ඒ ඇති කරගන්නා ක්‍රමය ගැන පමණයි අපේ කැමැත්ත. ඕනෑම ආකාරයක ක්‍රියා දාමයක් ඇති කරගන්නට කමක් නැහැ. නමුත් එය ඇති කර ගත යුත්තේ ජනතාවගේ කැමැත්තෙන් පමණයි. ඒ ගොල්ලන්ට අවි ආයුධ පසෙක තබා ජනසම්මත වාදයෙන් එය ලබාගන්නට මේ රටේ ජනතාව කැමති වුනොත් ඕනෑම ආකල්පයක පාලනයක් ඇති කර ගන්න. ඒකට අපේ කිසිම විරුද්ධතාවයක් නැහැ. මං කියන්න කැමතියි ඒ ජනමතය යටපත් කොට අවිආයුධ මගින් ඔය පරමාර්ථය ඉටුකර ගැනීමට අපි කිසිසේත් අවකාශ නොදෙන බව මං මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට කැමතියි.

මේ වැඩ පිළිවෙලේදී විදේශීය බලවේග පමණක් නොව දේශීය බලවේග පවා ක්‍රියාත්මක වන බව අප අමතක නොකල යුතුයි. ජන කැමැත්තෙන් ජන මතයෙන් සර්වජන ඡන්ද බලයෙන් ඇති කරන්නට බැරි පරිවර්තනය වෙනත් ක්‍රම මගින් ලබා ගන්නටයි උත්සාහ කරන්නේ. එක අතකින් වෙඩි උණ්ඩ මගින්, එක අතකින් ත්‍රස්තවාදයෙන්, දාමරිකකම් වලින්. අනෙක් අතින් සටකපටකම් වලින් ආගම් අතර බෙද ඇති කොට ආගමිකයින් ඇණ කොටා ගන්නට සලස්වමින් ළඟදී එක්තරා දේවස්ථානයකට ගොසින් වෙනත් ආගමික ප්‍රතිරූපයක් තිබ්බා. වාසනාවකට වාගේ සර්ව සාමයික වැඩ පිළිවෙලක් ආරම්භ කර තිබුණ නිසා ඒ පූජ්‍යස්ථානයේ උදවිය ඒ ගැන හොදට කල්පනා කර බැලුවා. සොයාගෙන ගියහම මේක සට කපට වැඩ පිළිවෙලක් ආගම් භේදය ඇවිස්සීමට එය කර තිබෙන්නේ. ඒක එතනින්ම නිගඩ වුනා. ඔය විදිහට විවිධ ආගමිකයින් අතර භේද ඇති කොට මේ රට මේ සමාජය විනාශ කිරීමට කරන ප්‍රයත්නයක්.

වැඩ කරන ජනතාව අතර මේ රටේ දුගී දුප්පත් කම නැති කිරීම පිණිස අපි ආරම්භ කර තිබෙන සංවර්ධන ක්‍රියා දාමයට සම්බන්ධ වී මෙතෙක් ආදායම් මාර්ග නැතිව හිටපු විශාල කොටසක් රැකියාවල් ලබමින් තමන්ගේ සේවය කරගෙන යන වේලාවේ ඔවුන් අතරත් වාද භේද ඇති කොට වැඩ වර්ජන ආදී කලබල ඇති කොට කලබැගෑනි මාර්ගයෙන් රට විනාශ කිරීමට ප්‍රයත්නයක් දරනව. තුන්වැනි අංශය තමයි: අපේ රටේ අහිංසක පාසැල් සිසු දරුවන් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහ සාමාන්‍ය ක්ෂේත්‍රයේ පාසැල් වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර නොයෙක් විදියේ දුර්මත ප්‍රචාරයන් පෙලඹවීමෙන් බලහත්කාරයෙන්—ඔක්කොටමත් වඩා බලහත්කාරයෙන්—ඒ අහිංසක දරුවන් විනාශ මුඛයකට දාමින් මේ රට නැති හංග කිරීමේ ප්‍රයත්නයකුත් තිබෙනව.

සහෝදර සහෝදරියනි, කරුණාකර මේ පණිවිඩය තමුන්නාන්සේලා ගේ ගම් නියම්ගම්වලට ගෙන යන්න. ගරුතර මහා සංඝයාවහන්ස, අනෙකුත් ආගමික පූජකයින් වහන්ස, පාසල්වල ඉගැන්වීම කරන අපේ ගුරු මහත්වරුනි, නෝනා මහත්වරුනි, දෙමව්පියනි, මේ කුට උපක්‍රමවලට තමුන්නාන්සේලා ගේ අහිංසක දරුවන් කැප කර ගන්නට ඉඩ තබන්නට එපා. නොයෙකුත් විධියේ කලබල ඇතිකොට නොයෙකුත් විධියේ ප්‍රචාර ඇතිකොට නොයෙකුත් විධියේ පෙලඹවීම් කොට මේ අවස්ථාවේ වියවුල් ඇති කරන්නට උත්සාහ කරනවා. එක් අතකින් අධ්‍යාත්මික ගුණවගාව, අනික් අතින් ආර්ථික සමෘධිය ඇති කරන්නට අවංක ප්‍රයත්නයක් දරන වෙලාවේ.

සහෝදර සහෝදරියනි, මෙවැනි නාස්තිකාරී විනාශකාරී වැඩපිළිවෙලක් ඇති වෙනවා. මා ප්‍රශංසා කරනවා ඊයේ පෙරේද ඇති කරන්නට ගිය කලබැගෑනියේ දී ඊවාට මුලා නොවී ඉවසිලිවන්තව ක්‍රියා කල සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට, අපේ ගුරුවර ගුරුවරියන්ට අපේ දෙමව්පියන්ට, මා මේ අවස්ථාවේදී නමස්කාර පූර්වකව අපේ ගෞරවය පිරිනමනවා. ඊයේ පෙරේද ඇති කරන්නට ගියේ එවැනි කලබැගෑනියක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එක්තරා පළාතක එක්තරා පාසලකට හදිසියේ තුන් හතර දෙනෙක් ගියා. ගිහිල්ල මුල් ගුරුවරයාටත්, ගුරුවරුන්ටත් එක පාරටම හඬනගා කිව්වා. " දන්නවාද වෙලා තියෙන විපත. ගුරුවරු මෙච්චර ගානක් මරාදලා, ශිෂ්‍යයෝ මෙච්චර ගානක් මරාදලා, ඒ ආරංචියට ගිය දෙමව්පියෝ මෙච්චර ගානක් මරාදලා. මොකද තමුසෙලා බලාගෙන ඉන්නේ " මේ බුද්ධිමත් ගුරුවරයා මේ පණිවිඩය ගෙනාපු දෙතුන් දෙනා දිහා බලලා මේ දුෂ්ට ප්‍රචාරය ඉදිරිපත් කළ පුද්ගලයාගේ කට තදකරගෙන යාලුවා, කෑ ගහන්න එපා. එන්ට කියා කාමරයට එක්කරගෙන ගියා. ගිහිල්ලා කාමරයට මේ පිරිස දගෙන එක පාරට එළියට ඇවිත් දෙරේ යතුරු දලා මේ කාරණය අනෙකුන් අයට කිව්වා. ඒ ගොල්ලන්ට මේ ආරංචිය කියන බව ඇහුණා. ගුරුතුමාට මතක නැතිවුණා ජනේල වහන්න අරුන් කීපදෙනා පැනලා ගියා ජනේලයෙන්.

සහෝදර සහෝදරියනි, මගේ ගෞරවය ඒ බුද්ධිමත් ගුරුතුමාට මේ මහජන සන්නිපාතයේ සිටගෙන ප්‍රණාමය කරන බව මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. මේ පණිවුඩය මං දෙන්න කැමතියි, අද මෙතන සිටගෙන ඉන්න, ශ්‍රී ලංකා වාසී අපේ සිසු දරුදැරියන්ට, අපේ ගුරුවර දෙමාපියන්ට. මට ආරංචියක් තියෙනවා, ඒ භයානක උත්සාහය තවමත් අත්හැරියේ නැහැ කියලා. අධ්‍යාපන ඇමතිතුමා මට උදේ හම්බ වුණා. ඊයේ පෙරේද උසස් අධ්‍යාපන වැඩබලන ඇමතිතුමා මාව හම්බ වුණා. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා මාව හම්බ වුණා. මං එතුමන්ලා හැමදෙනාටම ස්තුතිවන්ත වෙනවා, අපේ සිසු කැල ආරක්ෂා කිරීමට පියවර ගැනීම ගැන. මම එතුමන්ලාට කිව්වා, අපේ විශ්වාසය තබමු, අපේ ගුරුවරුන් කෙරෙහි. අපේ විශ්වාසය තබමු, අපේ හොඳ ශිෂ්‍යයින් සහ දෙමව්පියන් කෙරෙහි. අපි ඔවුන්ට කියමු, ඉතා සුළු කොටසක් මේ විධියේ විෂමාචාරයක යෙදෙනවා. මේ විධියේ විෂමාචාර ගෙන යනවා. ගමින් ගම යනවා. පාසලෙන් පාසලට යනවා. මොකටද මේ විනාශකාරීන් ඉදිරියට එන්නේ නැතිව අහිංසක සිසුකැල මේ වැඩ පිළිවෙල ඉදිරියට දමා කලබල ඇතිකොට ඔවුන් පිටුපස ඉඳගෙන සිසු දරුවන් කරනවා වගේ අපරාධකාරී ක්‍රියාවල් කොට ආරක්ෂක අංශවලට වෙඩි තැබීමට පොළඹවන්නෙ. ඒක තමයි ඔවුන්ගෙ එකම පරමාර්ථය.

මම පාර්ලිමේන්තුවේදී කියල ආවෙ දවස් දෙකකට ඉස්සෙල්ලා අනේ දන් අවුරුදු හත අටක්ම විරුද්ධ පක්ෂයේ උදවිය මළකඳක් සොය සොයා ඉන්නේ දන් බොහොම සන්තෝෂයිනේ, අහිංසක දරුවෙක් දෙන්නෙක් මරපු එක ගැන සතුටු වෙනවනේ. මුං මෙව ගැන ලැජ්ජා වෙන්නෙ නැත්තෙ. මේ මාර්ගයෙන් පුළුවන්ද රටක බලයක් ලබාගන්ට, අපි එහෙම කළේ නැහැ. විපක්ෂයේ ඉන්නකොට, කැරැල්ල ඇති වෙච්ච වෙලාවෙ අපේ ජනාධිපතිතුමා එද රජයට එක්වරම කිව්වා අපේ සම්පූර්ණ සහාය දෙනවා මේ කැරැල්ල මර්දනයට. එද අර විරසූරිය ශිෂ්‍යයා විශ්වවිද්‍යාලයේදී මරා දමාපු විට පාසල්වල කලබැගෑනි ඇති වුණා. අපි මොකද කළේ ? ඒවා උත්සන්න කිරීමට ක්‍රියා කළේ නැහැ. ඇතැම් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගුරුවරුන් මාව වටකර ගත්තා. මං කිව්වා මරදනේදී මාව වටකරගත්තම මගෙන් ඇහැව්වා මන්ත්‍රීතුමා හොද වෙලාව නේද මේ වෙලාව. ඇයි අපට උදව් කරන්නේ නැත්තේ. මම කිව්වා මේ මාර්ගයෙන් බලයට එන්නට අපේ කිසිම බලාපොරොත්තුවක් නැහැ. කරුණාකරලා පෙරලා පාසලට යන්න. අසාධාරණයක් වුණා නම් අපි ඒ ගැන බලන්නම්. අපි ඉන්නේ ඒ සඳහා. අපි ඒ විධියට උඩගෙඩි දුන්නේ නැහැ.

වැඩ වර්ජන ඇති වූ වෙලාවෙත් අපේ ජනාධිපතිතුමා ක්‍රියා කළේත් එහෙමයි. අර රේල්ලුවේ වැඩ වර්ජනයක් ඇතිවෙලා යම් මුදල් ප්‍රමාණයක් ඉල්ලපු වෙලාවෙ ජනාධිපතිතුමා ඇහුවේ විපක්ෂයේ ඉඳගෙන හොඳයි අපේ ආණ්ඩුවක් නම් අපටත් මේක කරන්න පුළුවන්ද. අන්න එහෙමයි සහෝදර සහෝදරියනි, රටක වගකීමක් ගැන හැඟීමක් ඇති පිරිස ක්‍රියා කරන්නේ. එහෙම නැතිව මේ මළකඳන් මගින් බලය සෙවීම තරම් පහත් උච්ච නින්දිත ක්‍රියාදමයක් තවත් නැති බව තමුන්නාන්සේලා පිළිගන්නවා. ලොකු කණගාටුවක් ඇති වෙනවා. මම ආයාචනය කරනවා ගරුතර මහා සංඝරත්නයට අනෙකුත් පූජකයන් වහන්සේලාට අපේ ගුරුවරුන්ට දෙමාපියන්ට අපේ සංවර්ධන සභාවලට කරුණාකර මේ විනාශය මේ විපත්තිය, අපේ රටට කරන්න ඉඩ දෙන්න එපා. ආගමික අංශයෙන් වේවා, වෘත්තීය අංශයෙන් වේවා අපේ අධ්‍යාපනික ක්ෂෙත්‍රයේ අපේ දරු දැරියන් බිලිදීමෙන් මේ ඇතැම් නාස්තිවාදීන් විනාශකාරීන් ඔවුන්ගේ ලේ පිපාසාව සංසිඳවා ගැනීමට ගෙන යන මේ ව්‍යාපාරය සාර්ථක කර ගන්ට ඉඩ දෙන්න එපා. මම දන්නවා අද මේ ස්ථානයේ සිට විශාල පිරිසක් තමන්ගේ ගම්රටවල්වලට යනවා, අපේ ගරුතර මන්ත්‍රීවරු මැති ඇමතිවරු තමන්ගේ ප්‍රදේශවලට යනවා, තමුන්නාන්සේලා එහෙම ගියාම මතක තබාගන්න නොයෙකුත් ප්‍රදේශවලින් තමුන්නාන්සේලාගේ ප්‍රදේශ ආක්‍රමණය කරයි, සුළු පිරිස් එද ජූලි කලබලවලදී මොකක්ද කළේ. ඇතැම් උදවිය ඇතැම් ප්‍රදේශවලට ඇවිත් එහෙන් මෙහෙන් ගිනි තියලා කට කථා පතුරවලා පැනලා ගියා. පළාතෙ උදවිය දන්නේ නැහැ. පළාතේ නායකයෝ දන්නේ නැහැ. කරන කෙනෙක් නැහැ. කොහෙන් ඇවිල්ලා කවුරු කරල ගියාද, කියා දන්නේ නැහැ. එවැනි තත්ත්වයක් නැවතත් ඇති කරන්නට අවකාශ දෙන්ට එපා.

අපේ රජය තුවක්කු කෙරෙහි විශ්වාසය තබා තිබෙන රජයක් නොවේ. අපේ රජය වෙඩි උණ්ඩ වලින් මිනිසුන් පාලනය කරන්ට සූදානම් රජයක් නොවේ. අපේ රජය යුද්ධ ගැන විශ්වාසයක් තබන රජයක් නොවේ. අපේ එකම සටන දුගී දුප්පත්කම නැති කිරීමේ සටන පමණයි. සහෝදර සහෝදරියනි, අපේ විශ්වාසය තිබෙන්නේ දයාව, කරුණාව, මෛත්‍රිය, සමගිය, සාමය සංවරය කෙරෙහි පමණයි. එවැනි රජයකට ඇයි මෙවැනි විනාශකාරී අපරාධකාරී, ක්‍රියාදමයක් ක්‍රියාත්මක කරන්නේ. මෙවැනි වේලාවක වෙන රජයක් කියන්නේ මොකක්ද, ඔව් උඹලට වැඩිය තුවක්කු අපට තිබෙනවා. උඹලට වැඩිය බෝම්බ අපට තියෙනවා. අපි එහෙම කථා කරන්නට සූදානම් නැහැ. අපි මනුෂ්‍යයත්වය උසස් කොට සලකනවා. මිනිසුන් ජීවත් කරවීම තමයි මේ රජයේ එකම පරමාර්ථය බව මේ අවස්ථාවේදී මං ප්‍රකාශ කරන්න කැමතියි.

සහෝදර සහෝදරියනි, 1977 දී 1982 දී අපේ රජයට පැහැදිලි වරමක් මේ රටේ ජනතාව දී තිබෙනවා. මොකක්ද ඒ වරම ? අර දුගී දුප්පත්කම් නැමති සතුරාගෙන් මේ ජාතිය බේරාගැනීමේ වරමයි. ඒ ව්‍යායාමය අපි කරන්නට බලාපොරොත්තු වන්නේ සත්‍යයෙන්, අවිහිංසාවෙන්, ශක්තියෙන් හා හික්මීමෙන්. මෙව තමයි අපට තිබෙන අවි ආයුධ. සත්‍යයත්, අවිහිංසාවත්, විනයත්. මේවා හැර අපි ගොඩනැගූ අවි ආයුධ නැහැ. සහෝදර සහෝදරියනි, ඇතැම් උදවිය කියනවා ඒ ගොල්ල ත්‍රස්තවාදය මර්දනය කරාලු, සුමාන ගානකින්. අපි දන්නවා මර්දනය කරපු හැටි. විසිපන්දහක් පමණ පරලොව ඇරලා. අපි ආයුධ ගැන විශ්වාසයක් නැහැ. ඒකයි අපි ඉන්දියාවටත් කියන්නේ මේ වෙලාවෙ මේ රටේ අද ඇතිවී තිබෙන මේ තත්ත්වයෙන් අපේ රට බේරා ගැනීමට උපකාර කරන්නටය කියලා. මේ ත්‍රස්තවාදීන්ට ඉන්දියා භූමියේ ලැබී තිබෙන අවකාශය නිසයි අපට මේ තත්ත්වය මර්දනය කරන්නට අමාරු වී තිබෙන්නේ

අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමා ඊයේ නිව්යෝක් නුවරදීත් ප්‍රකාශ කළේ එතුමාගේ ඉන්දියානු චාරිකාවේ එකම පරමාර්ථය ඉන්දියාවට කියන්න කරුණාකරලා මේ විනාශකාරීන්ට උඩගෙඩි දෙන්න එපා, අපේ රටේ මිත්‍රත්වය ආරක්ෂා කරන්නට ක්‍රියා කරන්නට කියලයි. එතුමා ප්‍රකාශ කර තිබෙන්නේ.

මේ අවස්ථාවේදී දීර්ඝ ලෙස තමුන්නාන්සේලාට කතා කරන්නට සිදුවීම ගැන කණගාටුවෙනවා. නමුත් මම තමුන්නාන්සේලාට කියන්න කැමතියි මේ ක්‍රියාවලදී අපට ලැබෙන සහාය ගැන කල්පනා කරන විට තමුන්නාන්සේලා හා ඕනෑම කාලයක් ගත කරන්නට මම නිරන්තරයෙන්ම සූදානම්ව සිටිනවා. මේ ක්‍රියාදමයේ සාර්ථකත්වය තිබෙන්නේ තමුන්නාන්සේලා අතේ. මට විශාල පිරිසක් සහාය දෙනවා. මේ වැඩපිළිවෙලට. මා දන්නා පිරිසට වඩා නොදන්නා පිරිස වැඩියි. අපේ ආගමික පූජකයන් වහන්සේලා ඇතුලු, රජයේ නිලධාරීන් ඇතුලු අපේ මැති ඇමතිවරුන් ඇතුළු රට පුරාම ජීවත් වන විවිධ ජාතික ආගමික ජනතාවගෙන් මේ සහාය ලැබෙනවා. මේ ඔක්කොමටමත් වඩා ලොකු සහාය ලැබෙන්නේ ස්වභාව ධර්මයෙන් සහ පරිසරයෙන්.

අපි වඩ වඩාත් අධ්‍යාත්මික ගුණවගාව දියුණු කර ගත්තොත් සහෝදර සහෝදරයනි, ඒ සහයෝගය තව තවත් වැඩිවේය කියන විශ්වාසයක් තිබෙනවා. මේ තරම් රටේ ප්‍රගතියක් ඇති කරගෙන යනවිට ඇයි මේ.....මේ විධියේ විෂම උවදුරු ඇති වෙන්නෙ කියා කල්පනා කරනකොට මගේ අවංක හිතට එන එක අදහසක් තමුන්නාන්සේලා සමාවෙන්ඩ ඕනෑ කිව්වට. ඇයි මෙහෙම වෙන්නේ කියලා හිතනකොට, මට පණිවිඩයක් එනවා. තවම අපි එක් එක්කෙනා අපේ අධ්‍යාත්මික බලවේගය දියුණු කර ගන්නට දක්වන සැලකිල්ල මදි කියල. ධන සම්පත් මගින් නිලතල මගින් බල පුළුවන්කාරකම් මගින් අපි වැඩිදියුණුවන්නට කල්පනා කරන තරමවත් අපි අධ්‍යාත්මිකව වශයෙන් අපේ ඒ ශක්තිය දියුණුකර ගන්නට කල්පනා නොකරන නිසයි මේ විදියට බාධාවල්, හිරිහැර ඇතිවෙන්නෙ කියන පණිවිඩය මගේ හෘද සාක්ෂිය මට දෙනවා. මම එය අවංකව තමුන්නාන්සේලාට ප්‍රකාශ කරනවා.

සහෝදර සහෝදරියනි, මේ නිසා තමුන්නාන්සේලා හැම දෙනාටත්, මට උදව් උපකාර කරන හැම දෙනාටමත් මගේ ගෞරවය පිරිනමනවා. මගේ කථාව අවසාන කරන්නේ —

දුකින් පෙළෙන සත් දුක් නැතිවෙත්වා
බියෙන් වෙසෙන සත් බිය නැති වෙත්වා
සොවින් පෙළෙන සත් සොම්නස් වෙත්වා
නිතින් මෙහැම සත් සුවපත් වෙත්වා.

**සීමාසහිත දූනගහ පොල්නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය : සභාපති**

***தூனகஹ தென்னை உற்பத்தியாளர் கூட்டுறவுச் சங்க லிமிடெட் : தலைவர்***

DUNAGAHA COCONUT PRODUCERS' CO-OPERATIVE SOCIETY LTD : PRESIDENT

123/84

7. **ලක්ෂ්මන් ජයකොඩි මහතා (රිචඩ් පතිරණ මහතා—අක්මීමන—වෙනුවට)**

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திரு. ரிச்சட் பத்திரன—அக்மீமன சார்பாக)*

(Mr. Lakshman Jayakody – on behalf of Mr. Richard Pathirana – Akmeemana)

**කෘෂිකර්ම සංවර්ධනය හා පර්යේෂණ පිළිබඳ ඇමතිතුමා සහ ආහාර හා සමුපකාර ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :**

(අ) සීමාසහිත දූනගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතියේ වර්තමාන සභාපතිතුමාගේ නම සහ ලිපිනය එතුමා සඳහන් කරනවාද ?

(ආ) ඔහු 1950 න් පසුව එළඹුන දශකය තුළදී එම සමිතියේම මුදල් භාරකාර තනතුරක් දරා ඇති බව එතුමා දන්නවාද ?

(ඇ) හදිසියේ කරන ලද පරීක්ෂණයකදී විශාල මුදල් අඩුවක් අනාවරණය වීම නිසා, ඔහු තමා දැරූ තනතුර අතහැර ගොස් ඇති බව එතුමා දන්නවාද ?

(ඈ) සමුපකාර සමිතිය මගින් මෙම අඩුවූ මුදල අය කර ගැනීම සඳහා ඔහුට විරුද්ධව නීති මගින් කටයුතු කිරීමට යෑමේදී ඔහු විසින් එම මුදල සමිතියට ආපසු ගෙවා ඇති බව එතුමා දන්නවාද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ඉ) සමිතියේ මුදල් අයුතු ලෙස පරිහරණය කර ඇති තැනැත්තෙකු එම සමිතියේම සභාපති ධුරය දැරීම සමුපකාර අතුරු ව්‍යවස්ථාවලට පටහැනි නිසා ඔහුට විරුද්ධව එතුමා පියවරක් ගන්නේද ?

விவசாய அபிவிருத்தி, ஆராய்ச்சி அமைச்சரும் உணவு, கூட்டுறவு அமைச்சருமானவரைக் கேட்ட வினா :

(அ) வரையறுக்கப்பட்ட தூனகஹதென்னை உற்பத்தியாளர் கூட்டுறவுச் சங்கத்தின் தற்போதைய தலைவரின் பெயரையும் முகவரியையும் அவர் குறிப்பிடுவாரா ?

(ஆ) இவர் 1950 க்குப் பின்வரும் பத்து ஆண்டுக் காலத்தில் இச்சங்கத்தின் பணத்திற்குப் பொறுப்பான பதவியொன்றை வகித்தார் என்பதை அவர் அறிவாரா ?

(இ) திடீர்ப் பரிசோதனையின்போது பெருந்தொகைப் பணம் குறைந்திருப்பது கண்டுபிடிக்கப்பட்டதால் இவர் தாம் வகித்த பதவியைக் கைவிட்டுப்போனார் என்பதை அவர் அறிவாரா ?

(ஈ) கூட்டுறவுச்சங்கம் இக்குறைத் தொகையை அறவிட இவருக்கெதிராக சட்ட நடவடிக்கை எடுக்க முயன்றபொழுது இவர் அப்பணத்தைச் சங்கத்திற்குத் திருப்பிக் கொடுத்தாரென்பதை அவர் அறிவாரா ?

(உ) சங்கத்தின் பணத்தை முறையற்ற விதத்தில் பயன்படுத்தியுள்ள ஒருவர் அதே சங்கத்தின் தலைவர் பதவியை வகிப்பது கூட்டுறவு உபவிதிகளுக்கு முரணானதென்பதால், இவருக்கு எதிராக அவர் நடவடிக்கை எடுப்பாரா ?

asked the Minister of Agricultural Development and Research and Minister of Food and Co-operatives :

(*a*) Will he state the name and address of the present President of the Coconut Producers' Co-operative Society Ltd., Dunagaha ?

(*b*) Is he aware that he had held the post of cashier in the same society in the decade following 1950 ?

(*c*) Is he aware that when a shortage of a large sum of money was revealed at a sudden inspection he had vacated his post ?

(*d*) Is he aware that when the society was trying to institute legal action against him to recover this shortage he had refunded the money to the society ?

(*e*) Will he take action against him as it is contrary to co-operative by-laws for a person who misused the funds of a society to hold the post of president in that society ?

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා (නියෝජ්‍ය ආහාර හා සමුපකාර ඇමතිතුමා)**
**(திரு. சரத்சந்திர ராஜகருணா — உணவு, கூட்டுறவுப் பிரதி அமைச்சர்)**
(Mr. Sarathchandra Rajakaruna-Deputy Minister of Food & Co-operatives)

(අ) ඔව්. ජී. ජී. සමරසිංහ මහතා, රුක්මල්, හපුවලාන, මරදගහමුල.

(ආ) නැත.

(ඇ) නැත.

(ඈ) නැත.

(ඉ) පැන නොනඟී.

4-A 078462 (84/08)

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

The Hon. Minister of Industries and Scientific Affairs may now make his statement.

## බණිජතෙල් නීතිගත සංස්ථාවේ නිලධාරීන්ට විරුද්ධ චෝදනා : කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමාගේ ප්‍රකාශය

## பெற்ரோலியம் கூட்டுத்தாபன உத்தியோகத்தர்க்கெதிரான குற்றச்சாட்டுக்கள் : கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சரது அறிக்கை

## ALLEGATIONS AGAINST PETROLEUM CORPORATION OFFICIALS: STATEMENT BY THE MINISTER OF INDUSTRIES AND SCIENTIFIC AFFAIRS

**සිරිල් මැතිව් මහතා**
**(திரு. சிறில் மத்திவ்)**
(Mr. Cyril Mathew)

I would like to mention that yesterday the hon. Member for Attanagalla made certain allegations against certain unnamed people of the Petroleum Corporation. I wish to tell him that if he makes specific allegations against specific people I am ever ready to get them inquired into completely. Please do not make these wild allegations because they affect people who cannot reply to you. Please make your allegations specifically against specifically named people, and I shall certainly get them inquired into.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

Thank you for raising this matter because –

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

There is not question of a debate on this. He has made his statement.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

Yes, but I would also like to say that I take full responsibility for whatever I say in this House. At the same time I will certainly put down in writing whatever information I get on these allegations and send it to the Hon. Minister. The Hon. Minister can then come to this House with those letters and make his statement.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

We will leave it to the Minister. There is no debate on this.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කිරීම
## பௌத்த வழிபாட்டுத் தலங்களைப் பாதுகாத்தல்
## PRESERVATION OF BUDDHIST SHRINES

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [1983 සැප්තැම්බර් 9].***

*ஒத்திப்போடப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது. வினா—[9 செப்ரெம்பர் 1983]*

*Order read for resuming Adjourned Debate on Question (9th September 1983)*

"ලංකාවට ජාත්‍යන්තර කීර්තියක් ලබා දෙන බෞද්ධ සිද්ධස්ථාන වල් බිහිවී යා නොදී ආරක්ෂා කර ගැනීම සඳහා සෑම ග්‍රාම සේවක කොට්ඨාශයක් තුළම ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක බලා ගැනීමට බෞද්ධ භික්ෂූන්ට හැකි වන අයුරු රජය සංඝාවාස ඇති කොට නඩත්තු කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි." [දයාරත්න වලගම්බාහු මහතා]

*"இலங்கைக்குச் சர்வதேச கீர்த்தியைப் பெற்றுத் தருகின்ற பௌத்த வழிபாட்டுத் தலங்களைப் பாழடைய விடாமல் பாதுகாப்பதற்காக எல்லாக் கிராமசேவகர் பிரிவுகளிலுமுள்ள பௌத்த வழிபாட்டுத் தலங்களைப் பௌத்த பிக்குமார் கண்காணித்துக்கொள்வதற்கு இயலும் விதத்தில் அரசாங்கம் பிக்குகளுக்கான இருப்பிடங்களை ("சங்காவாஸ்") ஏற்படுத்தி அவைகளைப் பராமரிக்க வேண்டுமென இப்பாராளுமன்றம் கருதுகின்றது" [திரு. தயாரத்ன வலகம்பாகு.]*

*"That this Parliament is of opinion that the Government should establish and maintain monasteries for Bhikkus, so that they could look after the Buddhist shrines in every Grama Sevaka Division with a view to saving from dilapidation these shrines which have brought International fame to Sri Lanka"–(Mr. Dayaratne Walagambahu)*

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.*

*Question again proposed.*

පු. භා. 10.15

**ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහතා (කළුතර දිසා ඇමතිතුමා)**
**(திரு. இந்திரதாச ஹெற்றியாரச்சி — களுத்துறை மாவட்ட அமைச்சர்)**
(Mr. Indradasa Hettiarachchi District Minister, Kalutara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කිරීම සඳහා වූ මෙම යෝජනාව පිළිබඳ විවාදය කල් තබන අවස්ථාවේ දී මම කථා කරමින් සිටියේ මේ සිද්ධස්ථාන ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ගැනයි.

පන්සල ගරාවැටුණු ද සිට තමයි, අප සතුවූ සාරධර්ම ගරාවැටුණේ. අද අපට මුහුණපාන්නට සිදුවී තිබෙන ප්‍රශ්න රාශියකට මුල මේ පන්සලේ ගරාවැටීමයි. ජාතිවාදී ප්‍රශ්න, කුලවාදී ප්‍රශ්න හා ආගම් ප්‍රශ්න මුදුන්පත් වුණේ මේ නිසයි. පන්සලෙන් ලැබුණු පණිවුඩය තරම් සාම පණිවුඩයක් ලෝකයේ කිසිම ආයතනයකින් ලැබුණේ නැහැ. පන්සල ප්‍රකෘතිමත් කිරීම බෞද්ධයන්ට පමණක් ප්‍රයෝජනවත් වන දෙයක් නොවෙයි. එය සමස්ත ලාංකික ජනතාවටම හොඳින්, සාමයෙන් ජීවත්වීමට ඉවහල් වන දෙයක්. එනිසා පන්සල ප්‍රතිසංස්කරණය කිරීම සම්පූර්ණයෙන්ම රජයේ මුදලින්ම කිරීමට වඩා මහජනතාවගේ සම්බන්ධතාවය ඇතිව කිරීම ඉතාමත්ම වැදගත් වෙනවා.

පුරා විද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන කැණීම, ඒ සොයාගත්තා දේ ආරක්ෂා කිරීම ආදී වැඩ රජය මගින් කෙරෙන බව අපි දන්නවා. අපේ අතීතය අපට වඩාත් හොඳින් හඳුනාගැනීමට ඒක ඉතාමත්ම වැදගත් වෙනවා. එනිසා ඒ කටයුත්ත අපේ සංස්කෘතික කටයුතු භාර ඇමතිතුමා විසින් ඉතාමත්ම උසස් අන්දමින් විශාල මුදලක් වැයකොට, එනම් රුපියල් දස ලක්ෂ පන්සියයකටත් වැඩි මුදලක් වියදම්කොට සංස්කෘතික ත්‍රිකෝණ වැඩපිළිවෙළ යටතේ අද කරගෙන යනවා. එය මේ රටේ පමණක් නොවෙයි, මුළු ලෝකයේම විශාල ගෞරවයකට පාත්‍රවී තිබෙන බව විශේෂයෙන්ම අපි මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගමේ පන්සල හැදිය යුත්තේ ගමේ ජනතාවගේ සහභාගීත්වය ඇතුවයි. ගමේ පන්සලක් එහෙම නැත්නම් විහාරයක් රජය මගින්ම හැදුවොත් වෙන්නේ එය ප්‍රදර්ශන භාණ්ඩයක තත්ත්වයට වැටී ප්‍රදර්ශනයට පමණක් සීමා වෙයි. ඒ නිසා බෞද්ධ විහාරස්ථාන පන්සල් ආදිය රජය මගින් හැදුවොත් වෙන්නෙ බෞද්ධ අපි කල්පනා කරන අන්දමට, අපි බලාපොරොත්තු වන අන්දමට අපේ සාර ධර්ම දියුණු කර ගැනීමට පුළුවන්කමක් නැති වීමයි. ඒ නිසා රජය මගින්ම විහාරස්ථාන හදනවාට වඩා බෞද්ධයන්ම සම්බන්ධ කරගෙන, බෞද්ධ අදහස් අනුව, දායක සභාවල් මගින්ම ඒ පන්සල්වල කටයුතු කරනවා නම් අප බලාපොරොත්තු වන සාර ධර්ම ප්‍රගුණ කරගන්නට පුළුවන්වන බව මම කියන්න කැමතියි.

මේ අනුව, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජනයා පන්සල්වලට ගෙන්වීමට අපි වැඩපිළිවෙළක් ඇති කරන්න ඕනෑ. අපි දන්නවා උතුරු-නැගෙනහිර පළාත්වල තිබෙන විහාරස්ථානවලින් ඉස්සර මහජනයා ඈත් වෙන්න ඈත් වෙන්න ඒ විහාරස්ථාන බොහොමයක්ම අභාවයට පත් වූ බව. එසේ සිදු වීමට කරුණු රාශියක් තිබෙනවා. ඒ ගැන කරුණු ප්‍රකාශ කිරීමට මම බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ නිසා නැවතත් පන්සල්වලට මහජනයා කිට්ටු කරන්නට ඇති කළ යුතු වැඩපිළිවෙළක් ගැන අපි කල්පනා කරන්න ඕනෑ. ඒ සඳහා මේ වාගේ නවීන යුගවලදී සියලුම සන්නිවේදන මාර්ගයන් ප්‍රයෝජනයට ගන්නට අපි උත්සාහ දරන්න ඕනෑ.

අපි දන්නවා අපේ විහාරස්ථානවලට අවශ්‍ය කටයුතු කරන, උදව්ය එහෙම නැත්නම් නොයෙක් සමාජ කටයුතු කරන්න ඉදිරිපත් වන උදව්ය, ඒ වාගේම නිශ්ශබ්දව ඒ කටයුතුවල යෙදෙන උදව්ය ගම්වල ඉන්න බව. ඒ අයට මහජනයාගේ ගෞරවය ලැබෙන වැඩ පිළිවෙළවල් මේ රටේ තිබුණත් ඒ අය ඒ කටයුතු කෙරෙහි තව තවත් උනන්දු කරවීමටත් සෙසු මහජනතාව ඒ අතට පෙළඹවීමටත් සන්නිවේදන මාර්ග උපයෝගී කර ගැනීමේ වැඩපිළිවෙළක් ඇති කරන්න ඕනෑ. සන්නිවේදන මාර්ගවලින්, එනම් පුවත්පත් මාර්ගයෙන් සහ ගුවන් විදුලි මාර්ගයෙන් මේ වාගේ හොඳ වැඩවලට තැනක් ලබා දීමට ඉදිරිපත් වෙන්න ඕනෑ. දූත පත්‍රයක් අතට ගත්තම ඒ විධියේ දේවල් නොවෙයි අපට කියවන්නට ලැබෙන්නෙ. මේ රටේ කොහේ හෝ යම් පුද්ගලයෙක් එල්ලී මැරී තිබෙනවා නම් ඒකට විශාල තැනක් දී ප්‍රවෘත්තියක් පළ කරනව. එහෙම නැත්නම් යම් වරදක් කළ කෙනෙක් පිළිබඳව ප්‍රවෘත්තියක් පළ කරමින් ඒ පිළිබඳ විස්තර ගැන විශාල ලෙස කරුණු දක්වනවා. ඒ විධියේ දේවල් තමයි අපට පුවත්පත්වල දකින්න තිබෙන්නෙ. නමුත් මා කලින් සඳහන් කළ පරිදි යහපත් වැඩවලට ඉදිරිපත් වන්නන්ගේ ඒ වැඩ පිළිබඳව සන්නිවේදන මාර්ගවලින් ඒ අයට තැනක් ලබා දෙන්නෙ නැහැ. එම නිසා මේ කාරණය කෙරෙහි අපේ විශෙෂ අවධානය යොමු කර ඒ අයට සන්නිවේදන මාර්ගවලින් තැනක් දෙන්නට ක්‍රියා කරනවා නම් මම හිතනවා එය අපේ සාර ධර්ම වර්ධනයෙහිලා ඉතාමත් වැදගත් වෙනවාය කියා.

ගම්වල වැරදි කරන අය වැඩිම වුණොත් ඉන්නේ සියයට පස් දෙනෙක් පමණක් වෙන්න පුළුවන්. ඒ සියයට පස් දෙනා කරන වැරදි ගැන සන්නිවේදන මාර්ගවලින් විශාල තැනක් ලැබෙනවා. නමුත් පන්සලක් හැදුවාය කියා, එහෙම නැත්නම් හොඳ සමාජ සේවයක් කළාය කියා, ඒ කළ තැනැත්තා නිසා, ඒ කළ තැනැත්තා ගැන දෙන අල්ප ප්‍රචාරය දෙස බැලුවම එවැනි යහ වැඩ කෙරෙහි උනන්දුවක් ඇති කරවීමට තරම් ශක්තියත් සහයෝගයත් ඒ සන්නිවේදන මාර්ගවලින් ලැබෙන්නෙ නැහැ කියන එකයි, අපට ප්‍රකාශ කරන්න තිබෙන්නෙ.

යහපත් වැඩවලට ඉදිරිපත් වන අය ගැන අනෙක් මහජනයාටත් දැන ගන්න පුළුවන් ආකාරයට, ඒ ඉදිරිපත් වන අය තව-තවත් ධෛර්යවත් වන අන්දමට අපේ සන්නිවේදන මාධ්‍යයන් මාර්ගයෙන් ඒ හොඳ වැඩවලට, ප්‍රසිද්ධියත් ලබා දෙනවා නම්, දැනට වල් බිහි වී ගොස් තිබෙන බෞද්ධ සිද්ධස්ථාන නැවත ගොඩනැගීමට පමණක් නොව වර්තමානයේ හොඳින් තිබෙන විහාරස්ථාන ආදිය වල් බිහි වී යා නොදී ආරක්ෂා කර ගැනීමටත් එය රුකුලක් වන බව මේ අවස්ථාවේදී පෙන්වා දෙන්න කැමතියි. ඒ විධියට සන්නිවේදන මාධ්‍යයන් මාර්ගයෙන් ඒ කටයුතුවලට ප්‍රසිද්ධියක් ලැබීම ඒ සිද්ධස්ථාන ඉබේම දියුණු වන්නත් හේතු වන බව මා ප්‍රකාශ කරන්න ඕනෑ.

අද සාර්ථක අන්දමින් ක්‍රියාත්මක වන ග්‍රාමෝදය වැඩ පිළිවෙළේ එක අංශයක් තමයි, ප්‍රදේශයේ විහාරස්ථානවල – ඒ ඒ ආගමික සිද්ධස්ථානවල – දායක සභාවලට සම්බන්ධ වී එම සිද්ධස්ථානවල දියුණුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහා යම්කිසි සැලැස්මක් ඇති කොට ඒ අනුව කටයුතු කිරීමයි. ඒ මගින් ජනතාව එම සිද්ධස්ථානයේ වැඩ කටයතු සම්බන්ධයෙන් උනන්දු කරවීමත් ග්‍රාමෝදය මණ්ඩල ව්‍යාපාරය තුළින් ඇති වේය කියාත් බලාපොරොත්තු වෙනවා.

අප නොයෙකුත් සංවර්ධන ව්‍යාපාරවල ප්‍රගතිය හොයා බලනවා වගේම ඒ ගමේ ආගමික සිද්ධස්ථානවල ප්‍රගතිය හොයා බලන්නත් උනන්දු වෙනවා නම්, මේ යෝජනාවෙන් විස්තර කෙරෙන ආකාරයේ වල් බිහි වී තටබුන් වී ඇති බෞද්ධ සිද්ධස්ථාන වැඩි-දියුණු කිරීමට පමණක් නොව තිබෙන සිද්ධස්ථාන ආරක්ෂා කර ගැනීමටත් එය ඉවහල් වන බව මා නැවතත් අවධාරණයෙන් ප්‍රකාශ කරන්න කැමතියි.

අපේ රටේ ආර්ථික දියුණුවක් ඇති වේගෙන යන මෙවැනි අවධියක, විශේෂයෙන් මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වෙමින් පවතින වකවානුවක, ජනතාවට යහමින් මුදල්-හදල් ලැබෙන කාලයක ආධ්‍යාත්මික ගුණවගාව අමතක වීමට ඒ ආර්ථික දියුණුවත් එක්තරා අන්දමකින් බලපා තිබෙන බව පෙනෙනවා. ඊට යෙදිය හැකි එකම පිළියම තමයි, ගමේ පන්සලේ ස්වාමින් වහන්සේලාගේ අනුශාසකත්වය යටතේ ගමේ උදවිය සම්බන්ධ කරගෙන ඒ ආධ්‍යාත්මික දියුණුව රැක ගැනීමට, වැඩි කර ගැනීමට කටයුතු කිරීම.

ග්‍රාමෝදය මණ්ඩල වැඩ පිළිවෙළ යටතේ, ඒ කටයුත්ත සාර්ථක කර ගන්න සැහෙන ආධාරයක් දෙන්න පුළුවන්කම තිබෙනවා. සාංස්කෘතික අමාත්‍යංශයේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක කෙරෙන සාංස්කෘතික වැඩ පිළිවෙළවල් යටතේ ඒ ඒ විහාරස්ථානයේ දියුණුව සඳහා ආධාර ලබා දීම පිණිස උදවු දෙන්න ග්‍රාමෝදය මණ්ඩලවලට පුළුවන්කම තිබෙනවා. ඒ අතර දායක සභාවල් සම්බන්ධ කරගෙන ගමේ උදවියට ආගමානුකූලව ජීවත්වීම සඳහා අනුබල ලැබෙන යම්-යම් වැඩ පිළිවෙළවල් ඇති කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමත් ඉතා වැදගත් වන බව මෙහිදී මතක් කරන්න කැමැතියි.

මේ රටේ විහාරස්ථානවල වැඩ සිටින සංඝයා වහන්සේලා පිළිබඳව හොයා බැලුවාම අපට පෙනී ගියා, සංඝයා වහන්සේලා 15,000 කට වඩා නැති බව. මේ රටේ බෞද්ධ ජනගහණය හා සසඳා බැලුවාම ඒ සංඝයා වහන්සේලාගේ සංඛ්‍යාව ඉතා සුළු බව, කොහෙත්ම ප්‍රමාණවත් නොවන බව අපට පෙනෙනවා. එම නිසා අතිගරු ජනාධිපතිතුමාගේ ජන්ම දිනය, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ජන්ම දිනය හා ගරු මැති-ඇමතිවරුන්ගේම ජන්ම දින ආදිය මුල් කරගෙන අඩු තරමින් මේ රටේ කුල දරුවන් 50,000 ක්වත් පැවිදි කිරීමේ, මහණ කිරීමේ වැඩ පිළිවෙළක් දියත් කරන්න පුළුවන් නම් මේ යෝජනාවට මුල් වී තිබෙන ප්‍රශ්නයත් ඉබේම විසඳේය කියා මා විශ්වාස කරනවා.

යම්කිසි විධියකින් රටේ ජනගහණය අනුව පණස්දහක් දෙනා පැවිදි කරන්නට පුළුවන් නම් හුහක් දුරට එය මේ පැරණි බෞද්ධ විහාරස්ථාන ආරක්ෂා කිරීමටත්, රටේ ජනතාව තුළ ආධ්‍යාත්මික දියුණුවක් ඇති කිරීමටත්, කටයුතු කරන්නට පුළුවන් පිරිසක් බිහිකිරීමටත් ගත් පියවරක් හැටියට අපිට කල්පනා කරන්නට පුළුවන් වෙනවා. ඒ පැවිදි කරනු ලබන පණස්දහෙන් විසිපන්දහක් දෙනා ශාසනයේ ඉතිරි වුණත්, රටේ ආගමික දියුණුව ඇති කිරීමට ඒ ප්‍රමාණයත් සැහෙන සංඛ්‍යාවක් වෙනවා. ටික කලක් මහණ වෙලා ඉඳලා යම් පිරිසක් සිවුරු අතහැර ගියත් ඒ යන අය අතරේ වුවත් විශාල ප්‍රමාණයකට හික්මීමකුත් ඇති වෙනවා ඒ වගේම අපේ රටේ පැරණි බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කිරීමටත් ආධ්‍යාත්මික දියුණුවක් ඇති කිරීමටත්, අප බලාපොරොත්තු වන බෞද්ධ සාරධර්ම දියුණු කිරීමටත් මේ අංශයෙන් කටයුතු සම්පාදනය කරන්නට ඒ මගින් අපට පුළුවන් වෙනවා.

මහා සංඝයා වහන්සේගේ සුළු වරදක් දක්කත් එය ලොකු දෙයක් හැටියට හැමවිටම ප්‍රචාරය කිරීමේ පුරුද්දක්—හුවා දැක්වීමේ පුරුද්දක්—අප තුළ තිබෙනවා. මම නම් හැමදාම කියන දෙයක් තමයි, සංඝයා වහන්සේ ගත කරන පැවිදි ජීවිතය ඉතාමත් අමාරු දෙයක් බව. අද ලෝකයේ තිබෙන විවිධ දේ ගැන—සංකීරණත්වය ගැන—බලන විට විහාරස්ථානයකට වෙලා ආගමානුකූලව කටයුතු කරන එක ඉතාමත් අසීරු කාරණාවක් වෙනවා. එම නිසා මහා සංඝයා වහන්සේ ඒ කරන සේවය උසස් සේවයක් හැටියට අපි හැම විටම කල්පනා කරන්නට ඕනෑ. එසේම මහා සංඝයා වහන්සේගෙන් සිදුවන සුළු සුළු වැරදි ගැන අනවශ්‍ය ලෙස කියාපෑමෙන්ද උන්වහන්සේලාගේ අගුණ ප්‍රකාශ කිරීමෙන්ද වැළකී සිටීම වැදගත් කාලෝචිත කටයුත්තක් යයි මම කල්පනා කරනවා. විහාරස්ථානවල දියුණුව ගැන අපි කල්පනා කරනවා නම්, අපි හැම විටම මහාසංඝයා වහන්සේට සිවුපසයෙන් උපස්ථාන කිරීමට මෙන්ම මහාසංඝයා වහන්සේගේ අඩුපාඩුකම් සපුරාලීමටත් කටයුතු කළ යුතුයි. පොදුවේ හැම ගමකම ඇති දායක සභා විසින් පමණක් නොව හැම බෞද්ධයෙකු විසින්ම පෞද්ගලිකවත් මේ විධියට කල්පනා කරනවා නම් අපේ පැරණි බෞද්ධ විහාරස්ථාන දියුණු කිරීමට ඉතා අගනා අවස්ථාවක් සැලසෙන බව අපි කල්පනා කරන්නට ඕනෑ.

අපේ රටේ නොයෙකුත් විහාරස්ථානවලට ගියාම ඒ විහාරස්ථානවල නොයෙකුත් වැඩ කටයුතු ආරම්භ කරන්නට බලාපොරොත්තු වන අවස්ථාවලදී අපිට පෙනී යන දෙයක් තමයි ඒ විහාරස්ථානවලට මුහුණ පාන්නට සිදු වී ඇති මුදල් ප්‍රශ්නය. ඕනෑම හොඳ යෝජනාවක් විහාරස්ථානයේ දියුණුව සඳහා ගෙනාවත්, මතුවන ප්‍රශ්නය තමයි, කොහෙන්ද අපි මේ කටයුත්තට මුදල් හොයා ගන්නේ කියන එක. මේක වැදගත් ප්‍රශ්නයක්. ඉස්සර රජ කාලයේ නම් විහාරස්ථානවලට නින්දගම් ලැබී තිබුණා. බෙර ශබ්දය ඇසෙන දුර ප්‍රමාණය සැලකිල්ලට අරන් නොයෙකුත් ස්ථානවලින්, ඒ විහාරස්ථානයට සන්නස් මාර්ගයෙන් නින්දගම් ලබා දී තිබුණා. එවැනි නින්දගම් අද විහාරස්ථාන බොහොමයකට ඇත්තේ නැහැ. ඒ තිබුණු නින්දගම් ආදිය මහජනයා බලෙන් අල්ලාගෙන ඒ අය එයින් අද ප්‍රයෝජන ගන්නවා. ඒ නිසා ඒ විහාරස්ථානයට ආදායමක් ලැබෙන්නේ නැහැ. විහාරස්ථානවලට අයිති ඉඩකඩම් කොපමණ තිබුණත් බොහෝ විට ඒ ඉඩම්වලින් කිසිම ආදායමක් විහාරස්ථානයට ලැබෙන වැඩපිළිවෙළක් ඇත්තේත් නැහැ. ඒ සියල්ලම වෙනත් අය බුක්ති විඳිනවා. වෙන අය ඒවායින් ප්‍රයෝජන ගන්නවා. එම නිසා මෙවැනි විහාරස්ථාන ගැන සොයා බලා, එම විහාරස්ථානවල නඩත්තුව සඳහා සැහෙන ආදායමක් ලබා දෙන්නට කටයුතු කරනවා නම් පැරණි බෞද්ධ විහාරස්ථාන ආරක්ෂා කර දියුණු කරන්නට පුළුවන් තත්ත්වයක් ඇති කරන්නට අපට පුළුවන් වෙනවා.

ලෝක බෞද්ධ සම්මේලනය මෙවර ලංකාවේ පැවැති අවස්ථාවේදී ඉදිරිපත් වුණු යෝජනාවක් තමයි, ලෝක බෞද්ධයන්ගේ යහපත සඳහා බැංකුවක් ඇති කිරීම. මේ අදහස ලෝකයේ බෞද්ධාගම පවතින රටවල් ගැන කල්පනා කර අවුරුදු දෙදහස් පන්සියයක් මේ රටේ තිබුණු බෞද්ධ ශාසනය අවුරුදු පන් දහසක් කල් ආරක්ෂා කරන්නට පුළුවන් තත්ත්වයක මූලාරම්භයය කියලා අපිට කල්පනා කරන්නට පුළුවන් වෙනවා. අරමුදල් ගැන කල්පනා කරන විටත් ඒ තත්ත්ය එසේම බව පැහැදිලි වෙනවා.

දහම් පාසල් ගැන රටේ හැම තැනම සැලකිය යුතු උනන්දුවක් ඇති වී තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ පන්සල් පන්සිය දෙළහක් තිබෙනවා. මෑතක් වන තුරුම එයින් දෙසියයක පමණයි දහම් පාසල් තිබුණේ. නමුත් දැන් දහම් පාසල් හාර සියයට වැඩි ගණනක් ඇති කරන්නට අපට පුළුවන් වී තිබෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලා මේ සම්බන්ධයෙන් දක්වන උනන්දුව නිසාත් ශාසනාරක්ෂක මණ්ඩලවල වැඩ සඳහා සෑම මන්ත්‍රීවරයෙක්ම රුපියල් විසිපන් දහක් බැගින් ලබා දෙන නිසාත් දැන් දහම් පාසල්වල විශාල ප්‍රගතියක් ඇති වී තිබෙනවා. එක කොට්ඨාශයක ශාසනාරක්ෂක මණ්ඩලයක් සඳහා අපි අවුරුදු පතා රුපියල් පන්දහස ගණනේ වියදම් කරනවා. ශාසනාරක්ෂක මණ්ඩලවල ලිපිගොනු සකස් කර ගැනීමට පවා එද මුදල් අතින් ඒවාට ශක්තියක් තිබුණේ නැහැ. ලිපි ලේඛන සඳහා අවශ්‍ය කඩදාසි ලබා ගැනීමට පවා ඒවාට පුළුවන්කමක් තිබුණේ නැහැ. නමුත් ගරු මන්ත්‍රීතුමන්ලාගේ වැදගත් අදහස් අනුව දැන් දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල ක්‍රමානුකූලව පවත්වා ගෙන යෑමට අපට පුළුවන් වී තිබෙනවා. ඒ වාගේම උප දිසාපති කොට්ඨාශවල තිබෙන ශාසනාරක්ෂක මණ්ඩලවලට නව පණක් දීමට අපට පුළුවන් වී තිබෙනවා. මේ නිසා දහම් පාසල් සම්බන්ධයෙන් සැහෙන වැඩ පිළිවෙළක් ඇති කරන්නටත් පුළුවන් වී තිබෙනවා. මෙය ඉතාම වැදගත් කරුණක් හැටියට අපි කල්පනා කරනවා. මේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් විශාල උද්‍යෝගයක් දැන් මහජනතාව තුළ ඇති වී තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ දහම් පාසල් හාර සියයකට වැඩි ගණනක් ඇති කරන්නට පුළුවන් වී තිබෙන්නේත් මේ වැඩ පිළිවෙළ නිසායි.

ගරු ජනාධිපති උතුමාණන් විසින් දහම් පාසල් යන ළමයින්ටත් නොමිලයේ පොත් දීම ගැන අද මුළු රටේම බෞද්ධ ජනතාව එතුමාට ගෞරවය පිරිනමනවා. කළුතර දිස්ත්‍රික්කයේ එද දහම් පාසල් යන ළමයින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහතා]

සිටියේ සිය දාහක් පමණයි. නමුත් අද එය ලක්ෂයකටත් වඩා වැඩි වී තිබෙනවා. මෙය ජනාධිපති උතුමාණන් දහම් පාසල් යන ළමයින්ට නොමිලයේ පොත් ලබා දීම නිසා ඇති වුණු විශේෂ සිද්ධියක්.

දහම් පාසල් ගුරුවරුන්ට බස්වල යැම ඊම සඳහා බලපත්‍රයක් දීම ගැනත් සඳහන් කරන ලෙස ගමනාගමන නියෝජ්‍ය ඇමතිතුමාත් හම්බන්තොට දිසා ඇමතිතුමාත් ඉල්ලීමක් කරනවා. එය ඉතාම වැදගත් කරුණක්. දහම් පාසලට යැමට බලපත් දෙනවාටත් වඩා හොඳ දෙයක් ලංකා ගමනාගමන මණ්ඩලයට කරන්නට පුළුවනි. මෙම ගුරුවරුන්ට අවුරුදු පතා වන්දනා ගමනක් යැම සඳහා බලපත්‍රයක් බැගින් දෙන්නට පුළුවන් නම් ඉතාම හොඳයි. එය ඉතාම වැදගත් වෙනවා.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

බලපත්‍රයක් වෙනුවට බස් එකක් දෙනවා නම් ඊත් හොඳයි.

සිරිල් මැතිව් මහතා
(திரு. சிறில் மத்தியு)
(Mr. Cyril Mathew)

විශේෂයෙන්ම උතුරු නැගෙනහිර පළාත්වලට යන්න ඕන.

ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහතා
(திரு. இந்திரதாச ஹெற்றியாரச்சி)
(Mr. Indradasa Hettiarachchi)

ඔව්. උතුරු නැගෙනහිර පළාත්වල බෞද්ධ සිද්ධස්ථාන සම්බන්ධයෙන් අපේ ගරු කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ඇමතිතුමා වැදගත් වැඩ පිළිවෙළක් දියත් කර තිබෙනවා. එතුමා ගෙන යන ඒ වැඩ පිළිවෙළ අනුව උතුරු නැගෙනහිර පළාත්වල තිබෙන බෞද්ධ සිද්ධස්ථාන බැලීම සඳහා යැමට දහම් පාසල් ගුරුවරුන්ට පාසලට යැමට දෙන බලපත්‍රයට අමතරව තවත් බලපත්‍රයක් දෙනවා නම් එය ඉතාම වැදගත් වෙනවා. අද මේ සම්බන්ධයෙන් මුළු රටේම චින්තනයේ විශාල වෙනසක් ඇති වී තිබෙනවා. ඒ නිසා මේ යෝජනාව ක්‍රියාත්මක වන විට විශේෂයෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශවල තිබෙන බෞද්ධ සිද්ධස්ථාන අලුත්වැඩියා කර ගන්නට පුළුවන් වෙනවා.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී තාග විහාරය අලුත්වැඩියා කළ යුතුය යනුවෙන් යෝජනාවක් ගේන්න බැරිද ?

ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහතා
(திரு. இந்திரதாச ஹெற்றியாரச்சி)
(Mr. Indradasa Hettiarachchi)

යෝජනාවක් ගේන්න කාටවත් තහනමක් නැහැ.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

මේ යෝජනාවටම ඇතුළත් කරන්න බැරිද ?

ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහතා
(திரு. இந்திரதாச ஹெற்றியாரச்சி)
(Mr. Indradasa Hettiarachchi)

මේ යෝජනාවට අතුරු යෝජනාවක්. ඒකට මේ යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා කැමති වේදැයි මම දන්නේ නැහැ. එහෙම කළොත් තාග විහාරය දියුණු කරන්න පුළුවන්.

බස් ගැන කතා කරන විට එක් කරුණක් සඳහන් කරන්න ඕන. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බලය තිබුණු කාලයේදී බස් පාවිච්චි කළේ මැයි දිනය සඳහා පමණයි.

රිචඩ් පතිරණ මහතා (අක්මීමන)
(திரு. றிச்சட் பத்திரன — அக்மீமன)
(Mr. Richard Pathirana Akmeemana)

තමුන්නාන්සේ කථා කරන්නෙ බස් ගැනද ?

ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහතා
(திரு. இந்திரதாச ஹெற்றியாரச்சி)
(Mr. Indradasa Hettiarachchi)

බස් ගැන ප්‍රශ්නයක් ඇසූ නිසයි මම කිව්වෙ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මැයි දිනයටත් ලංගම බස් පාවිච්චි කළා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

දැන් පාවිච්චි කරන්නෙ මැරවරකම්වලට.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

**Order, please!**

කොයි තරම් වැදගත් කථාවක්ද කරගෙන ගියේ ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

වැදගත් විධියට කථා කරගෙන ගොස් නොවැදගත් තත්ත්වයට පත් වුණා.

ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහතා
(திரு. இந்திரதாச ஹெற்றியாரச்சி)
(Mr. Indradasa Hettiarachchi)

මම ඉතාමත් වැදගත් අදහස් ටිකක් ප්‍රකාශ කරමිනුයි සිටියෙ. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයේ ඉන්න කාලයේදී මැයි දිනයට බස් පාවිච්චි කළ බව එක පාරටම මතක් කළා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අපි නොවෙයි. තමුන්නාන්සේතේ මතක් කළේ. අද බස් පාවිච්චි කරන්නෙ මැරවරකම්වලට බවයි අපි කිව්වෙ.

ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහතා
(திரு. இந்திரதாச ஹெற்றியாரச்சி)
(Mr. Indradasa Hettiarachchi)

එද මැයි දිනයට අපට එක් බස් එකක්වත් ගන්න පුළුවන්කමක් ලැබුණෙ නැහැ. අපි ආවෙ පෞද්ගලික බස්වලින් තමයි. මම දැන් කියන්නේ දහම් පාසල් ගුරුවරුන්ට බස්වලින් ගමන් කිරීමට බලපත්‍රයක් ලබා දිය යුතු බවයි. අවුරුද්දක්ම ගමන් කරන්නට හැකි වන සේ බලපත්‍රයක් ඒ අයට ලබා දෙනවා නම් ඒ අය තුළ විශාල උනන්දුවක් ඇති වෙනවා.

ඒ වගේම මා මතක් කරන්න කැමතියි. අද තිබෙන අධ්‍යාපන ක්‍රමයට අනුව පාසලේදීත් ආගමික අධ්‍යාපනයක් ලැබෙන නිසා දහම් පාසල් අධ්‍යාපනය කෙරෙහි ඒ තරම් උනන්දුවක් දැක්විය යුතු නැතැයි කියා සමහර උදවිය කල්පනා කරනවා. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට විෂයයක් හැටියට ගන්නට ආගම උගන්වන නිසා දහම් පාසල් නොගියාට කමක් නැත කියා සමහර අය කල්පනා කරනවා. ඇත්ත වශයෙන්ම ඒ අදහස වැරදියි. මහා සංඝයා වහන්සේලාගේ ආශ්‍රය ඇතිව ආගමික පරිසරයක් තුළ ජීවත් වීමෙන් හැඩගැස්වා ගැනීමට හැකි උසස් ජීවිතය පාසල් අධ්‍යාපනයෙන් පමණක් ලබා ගන්නට බැරි වෙන බව මා තරයේම ප්‍රකාශ කරන්න ඕන. පාසලේදී විෂයයක් හැටියට බුද්ධාගම උගන්වන නිසාම දහම් පාසල් නොගියාට කමක් නැත කියා සිතීම සම්පූර්ණයෙන්ම වැරදියි. මහා සංඝයා වහන්සේලා සමග කිට්ටු සම්බන්ධයක් ඇතිව ආගමික අධ්‍යාපනයක් ලබා දුන්නොත් තමයි අපි බලාපොරොත්තු වන වැඩපිළිවෙළ සාර්ථක කර ගන්නට පුළුවන් වන්නෙ. ඒ නිසා දහම් පාසල් අධ්‍යාපනයෙන් පාසල් අධ්‍යාපනයෙන් වෙනසක් තිබෙන බව අපි කල්පනා කරන්න ඕන.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දහම් පාසල් අධ්‍යාපනයේ සහ සාමාන්‍ය පාඨශාලා අධ්‍යාපනයේ දකින්නට තිබෙන වෙනස මෙයයි ; දහම් පාසල් වෙත යන ශිෂ්‍යයන් සතියකට දවසක් පැය භාගයක් තුළ විහාර ගෙය ඇතුළේ කෙරෙන ඒ ආගමික වැඩ කටයුතුවලට සහභාගි වෙනවා. ඊළඟට බෝධීන් වහන්සේගේ සෙවන යට කෙරෙන ආගමික වැඩ කටයුතු වලට තවත් පැය භාගයක් පමණ ගත කරනවා. ඊළඟට විහාර මිදුලේ ඇති ගහක් යට ඉඳගෙන එක් පාඩමක් ඉගෙන ගන්නවා. ඊළඟට ධර්ම ශාලාව ඇතුළේ ඇති පන්තියකටත් සහභාගි වෙනවා. නමත් ඉගෙන ගන්නා ගාථා ආදිය මහාසංඝයා වහන්සේලාත් සමඟ ශබ්ද නගා කියවන්නට පුරුදු පුහුණු වෙනවා. ඔන්න ඔය විධියට හොඳ ජීවිතයකට අත්තිවාරම් දැමීම තමයි දහම් පාසල් අධ්‍යාපනයෙන් මූලික වශයෙන් සිදු වන්නෙ.

මමත් පොඩි කාලයේ දහම් පාසල් ගිය බව මට හැම තිස්සෙම කල්පනා වෙනවා. දහම් පාසල් යාමෙන් ඇති කර ගත් පුරුදු අපට තවමත් තිබෙනවා. මහා සංඝයා වහන්සේ නමක් පාරේ ගමන් කරනවා දුටුවත් ගෙදර ඉඳගෙන ඉන්න වෙලාවක වුණේ වී නමුත් අපිට එක පාරටම නැගිටින්න හිතෙන්නෙ ඒ නිසයි. එයට හේතුව මොකක්ද ? අර පොඩි කාලයේ දහම් පාසල්වලට ගිහින් ලැබුණු පුරුද්ද නිසා අද ඕනෑම තැනකදී ඒ ගෞරවය පිරිනමන්නට පුළුවන්කම ලැබී තිබෙනවා. මම ඇත්ත වශයෙන්ම ආඩම්බර වෙනවා —

**දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)**
**(திரு. தினேஷ் குணவர்த்தன — மஹரகம)**
(Mr. Dinesh Gunawardene–Maharagama)

ස්වාමින් වහන්සේලාව බිමට ඇදල පස්න ගහනවානේ.

**ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහතා**
**(திரு. இந்திரதாச ஹெற்றியாரச்சி)**
(Mr. Indradasa Hettiarachchi )

එහෙම කළේ මහජන එක්සත් පෙරමුණේ.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

නැහැ. තමුන්නාන්සේලාගේ පක්ෂයේ.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)

මාක්ස්වාදීන් කළේ.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

මාක්ස්වාදීන් නොවෙයි. තමුන්නාන්සේලාගේ පක්ෂය.

**ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහතා**
**(திரு. இந்திரதாச ஹெற்றியாரச்சி)**
(Mr. Indradasa Hettiarachchi )

එය කළේ දහම් පාසල් නොගිය අයයි. ඒ කළේ 1971 දී. 1971 දී ස්වාමීන් වහන්සේලා ඕනෑ තරම් මරල දැම්මා. ඒක වෙනත් කාරණයක්. දැන් අපි ඒ ගැන නොවෙයි කථා කරන්නේ. එක අවස්ථාවක් නිසා අනික් අවස්ථාවල් පෙන්වලා කඩාකප්පල් කිරීම් ඇති කිරීම ඊටත් වඩා භයානක දෙයක්. ඇත්ත වශයෙන්ම එය ඉතාමත් වැරදි ක්‍රියාවක්. 1971 දී ඇති වුණු අරගලයේදී හිටපු ආණ්ඩුවෙන් මෙපමණ ස්වාමීන් වහන්සේලා මැරුවාය කියා මට ඕනෑ නම් කියන්න පුළුවන්කම තිබෙනවා. නමුත් එය කීමෙන් අපි දැන් සාකච්ඡා කරන දෙය වෙනත් අංශකට හැරවීමයි සිදු වෙන්නේ.

**අනිල් මූණසිංහ මහතා**
**(திரு. அனில் முனசிங்ஹ)**
(Mr. Anil Moonesinghe)

එය කළේ ආණ්ඩුව නොවෙයි.

**ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහතා**
**(திரு. இந்திரதாச ஹெற்றியாரச்சி)**
(Mr. Indradasa Hettiarachchi )

ආණ්ඩුව හරිවෙන මොකක් හරි වෙන්න පුළුවන්. නමුත් දැන් අපි ඒ ගැන නොවෙයි කථා කරගෙන යන්නේ. ඔය වගේ ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ අපි කථාකරගෙන යන මේ වැදගත් කථාව වෙනත් අතකට යොමු කරවන්නයි.

විරුද්ධ පක්ෂය ඒ විධියට කල්පනා කිරීම ගැන මම කණගාටු වෙනවා. මෙය ඉතා වැදගත් ප්‍රශ්නයක්. මේ රටේ තිබෙන විහාරස්ථාන අළුත්වැඩියා කරල, ආගමික පරිසරයක් ඇති කරල ඒ ආගමික පරිසරය යටතේ ඒ සිතුම්-පැතුම් ඇතිව, ආධ්‍යාත්මික දියුණුවක් ඇතිව මේ රටේ සිටින සියළු දෙනාටම— අපේ කුඩා දරුවන්ගේ සිට සෑම දෙනාටම—ජීවත් වෙන්නට පුළුවන්කම ලැබෙනවා නම් මම හිතනවා මේ රටේ තිබෙන හුඟක් ප්‍රශ්නවලට විසඳුම එයයි කියා.

බණ මඩුවකට ගියාම අපි සැම එක්කෙනාම ඉඳ ගන්නේ බිම. මොකක්ද එහි තේරුම ? එහි ජාති භේදයක් නැහැ. ආගම් භේදයක් නැහැ. කුල භේදයක් නැහැ. හැම එක්කෙනාම බිම ඉඳගෙන කටයුතු කරන්නේ එක හා සමාන වැඩපිළිවෙලක් ඇති කරන්නටයි. මෙවැනි වැඩපිළිවෙලක් අපි වතුකරයේ ඇති කරන්නට ඕනෑ. අද දෙමළ ප්‍රශ්නය ඇති වී තිබෙනවා. වතුවල දහම් පාසල් ඇති කරන්නට ඇයි අපට බැරි ? උඩරට වතුවල සිංහල උගන්වන්නට පුළුවන් තරම් විශාල පිරිසක් පත් කරනවා නම් සියළුම බෞද්ධයන් එයට කැමතියි.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
**(திரு. எம். வின்சன்ற் பெரேரா — பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)**
(Mr. M. Vincent Perera–Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

I move,

"That the Debate be now adjourned."

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

*ඊට අනුකූලව විවාදය කල්තබන ලදී.*

*එතැන් සිට විවාදය 1984 සැප්තැම්බර් 7 වන සිකුරාද පවත්වනු ලැබේ.*

*இதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*விவாதம் 1984 செப்ரம்பர் 7 வெள்ளிக்கிழமை மீளத்தொடங்கும்.*

*The Debate stood adjourned accordingly.*

*Debate to be resumed on Friday, 7th September, 1984.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
(Mr. M. Vincent Perera)

I move,

"That the Parliament do now adjourn."

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**අනිල් මූණසිංහ මහතා (මතුගම)**
**(திரு. அனில் முனசிங்ஹ — மத்துகம)**
(Mr. Anil Moonesinghe–Matugama)

Sir, I want to raise firstly the question of damage caused to the roads in my area during the last floods. The Hon. District Minister also knows that, because of the landslides and floods, the whole road system in the Matugama area and partly in the Agalawatte and Bulathsinhala areas have been devastated. As a result the amount of monies that we allocated for the maintenance of the roads have been used up for

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනිල් මුණසිංහ මහතා]

patching up and repairing damaged roads due to landslides and floods. I find there is a shortfall of nearly Rs. 5 lakhs necessary for the continuance of the maintenance work. I find it is very difficult to get the money from the decentralized budget because all the monies have already been allocated for various purposes. So it is my urgent request that this sum of Rs. 5 lakhs or part thereof be released immediately to the Highways Department for this work to be carried out in the Matugama area.

The next matter I want to raise is with regard to betting in the country. Today everywhere, in every village, betting centres have come into being. In the most remote villages it has become one of the second biggest underground industries like the Kassippu industry. It is underground in the sense it is not supposed to be lawful, but it is in the twilight area. We do not know whether it is lawful or unlawful. We find that betting is now spreading its tentacles from the cities to the villages. The change is this. I find that many people working in estates in our areas, immediately they get their pay, are drawn to these betting centres or they have already taken bets and they are going to settle that. As a result of this when they come home they are unable to face their wives. So they take an extra drink also and go home. This has resulted in terrible domestic troubles. It is a great pity to see children neglected because of this prolific betting in the rural areas. Earlier also this was restricted to some areas in the City. Betting centres were kept going as underground centres. It was supposed not to be legal. But there was a flourishing underground industry in the city. Now, with the growth of poverty in th rural areas the betting habit has spread to the rural areas. I want to ask the government what its policy is on betting. The Hon. District Minister was speaking all about protecting our temples in our areas. I agree one hundred per cent with that. But what is the use of protecting the temples when the social fabric is being destroyed by betting ? Earlier the Urban Development Authority did not give permission to hotels dealing exclusively with foreign clientele to have betting or any type of gambling and they said it is government policy that no gambling is to be allowed even for foreigners because many people wanted to come and open up casinos in Trincomalee and such other places like that. Then one fine day we found gambling taking place in the very vicinity of the Central Bank of Sri Lanka. I think in the third floor. There is a big gambling casino. It is called Palm Beach or something like that–and it is (*Interruption*) Pardon ? How do I know. Do you think you have to visit every place to know these things ? I know the places you visit which I have not visited.

All I am trying to say is that betting is taking place. My good Friend is trying to divert me and make a joke of it. Please do not make a joke of this, because it is a serious subject. This is really eating into the vitals of our country. That is why I want the co-operation of the Government in trying to eradicate this menace. This is something which we have fought against–drinking and betting–for a long time. Actually, the freedom movement of this country started with the attack on liquor, to have people desist from taking liquor. This is the beginning of the Sri Lanka movement. Then we found that betting is also an ancilliary of this. There are a number of places opened now in the city of Colombo like Palm Beach and Golden Topaz. Various names have been given to me. Now, Sir, what is the attitude of the Government on this ? I would like to know that.

Then, Sir, we also find various twilight areas growing up ! A number of places in Colombo have become houses of illfame. Only they are not called that. I find that in a Municipal area of Colombo, despite the Police going and raiding some of these places, the Police have been asked not to raid these places. (*Interruption*) I do not know, it was done by the Colombo Municipal Authorities. It is a place called "Yataro". A number of places here are being run as places of prostitution. I would like to know what the Government's policy is on this. I would like the Hon. Prime Minister to go into this question. Why was this raid stopped ? Why was a licence issued ? They license it as a restaurant and then they run all these other things. I would like to know what the Government's policy is in regard to these two aspects of our country's life.

**එච්. බී. අබේරත්න මහතා (නියෝජ්‍ය ගමනාගමන මණ්ඩල පිළිබඳ ඇමතිතුමා)**

(திரு. எச். பி. அபேரத்ன — போக்குவரத்துச் சபைகள் பிரதி அமைச்சர்)

(Mr. H. B. Abeyratne–Deputy Minister for Transport Boards)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින මා කල්දී ඇති ප්‍රශ්නයට අදාළ කාරණය මෙයයි. අඹන්පොල පොලීසියේ පී. එම්. මුදියන්සේ නමැති පොලිස් සාජන්ට් වරයෙක්, පසුගිය දිනවල පැවැත්වුණු අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයකට පෙනී සිටි ශිෂ්‍යයකු අත් අඩංගුවට ගෙන ඔහුට නොසැහෙන විධියට තලා පෙලා, අඩම්තේට්ටම් කර ඉන් පසුව මේ ශිෂ්‍යයා අඹන්පොල රෝහලේ ප්‍රධාන වෛද්‍යවරිය වෙත යොමු කර තිබෙනවා. සාමාන්‍යයෙන් යම් කෙනෙක් පොලිස් අත් අඩංගුවට ගත්තාම එයා වෛද්‍යවරයකුට යොමු කරන්නේ එක්කෝ තුවාල සිදු වුණාම, එහෙම නැතිනම් මත්පැන් බී සිටියාම, එහෙම නැතිනම් වෙනත් අසනීපයක් නිසා. එහෙමත් නැතිනම් චූදිතයා විසින් පොලීසියෙන් ඉල්ලීමක් කළොත් පමණයි. මේ අවස්ථාවේදී මොන හේතුවකටද කියන්න මම දන්නෙ නැහැ. මේ පාසැල් ශිෂ්‍යයා අඹන්පොල රෝහලේ අර වෛද්‍යවරිය වෙත ඉදිරිපත් කර එයාගෙන් වාර්තාවක් ලබා ගෙන නැවතත් පොලීසියට ගෙනැවිත් නිදහස් කර තිබෙනවා. ඉන් අනතුරුව ඒ ළමයාගේ දෙමව්පියන් මේ ළමයා නැවතත් රෝහලට කැඳවා ගෙන ගිහින් අර වෛද්‍යවරියගෙන් ප්‍රතිකාර ඉල්ලා සිටියාම " මෙයට මොහොතකට ප්‍රථම අඹන්පොල පොලීසියේ නිලධාරීන් විසින් මේ ළමයා මා ළඟට ගෙන ආවා. මම මෙයාව පරීක්ෂා කර බැලුවා. මෙයාට කියන්නට තරම් අසනීපයක් නැහැ. ගෙදර ගිහින් සිද්ධාලේපය ටිකක් ගා ගන්නය " කියා ඒ වෛද්‍යවරිය කියා තිබෙනවා. එහෙම කිව්වාට පස්සෙ, ඒ ළමයාගේ දෙමව්පියන්, අඹන්පොල රෝහලේ සිට හැතැක්ම හයක් පමණ ඈත පිහිටි ගල්ගමුවේ රෝහලට ළමයා කැඳවා ගෙන ගිහින් එහි ප්‍රධාන වෛද්‍ය නිලධාරී තුමාට පෙන්නුවාට පස්සෙ, ළමයා රෝහලට ඇතුළත් කළා පමණක් නොවෙයි, දින තුනක්ම එම ආරෝග්‍යශාලාවේ නවතා ගෙන ප්‍රතිකාර කළත් ළමයාගේ තත්ත්වය අසාධ්‍ය නිසා, දිගින් දිගටම නහයෙන් ලේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගලන නිසා, එතුමාට වඩා ඒ ළමයාට ඇප උපස්ථාන කරන්නට පුළුවන් ස්ථානයකට. ඒ කියන්නේ අනුරාධපුර මහ රෝහලට ඇම්බියුලන්ස් එකෙන් ගෙනගිහින් භාර දී තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෛද්‍යවරිය ගැන මම දන්නේ නැහැ. ඇමතිතුමා දන්නවාද කියන්න මම දන්නෙත් නැහැ. නමුත් මේ තරම් අසාධ්‍ය ලෙඩෙක් නැවත වරක් තමන් වෙත ඉදිරිපත් කරන විට සිද්ධාලේපය ගාන්නට යයි කියන්නේ, ඒ වෛද්‍යවරිය සිද්ධාලේපයට ප්‍රචාරයක් දෙන නියෝජිතයෙක් නිසාද, එහෙම නැතිනම් පොලීසිය විසින් සිදු කරන මේ අසාධාරණකම්වලට අනුබල දෙන නිලධාරිනියක් නිසාද, එහෙමත් නැත්නම් වෛද්‍ය වෘත්තිය ගැන කිසිම හැඟීමක්, දැනුමක් නැති කාන්තාවක් නිසාද කියා පරීක්ෂා කරන ලෙස ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

අමරසිරි දොඩන්ගොඩ මහතා (බද්දේගම)
(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)
(Mr. Amarasiri Dodangoda Baddegama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ප්‍රශ්නයත් මෙම රෝහල්වලට සම්බන්ධ ප්‍රශ්නයක්. අනුරාධපුර යුද හමුදා කඳවුරේ සාජන්ට් කෙනෙකු විසින් අනුරාධපුර ආරෝග්‍යශාලාවේ දන්ත වෛද්‍යවරුන්ට අපහාස වන අන්දමින් බැණ වැදීමක් ගැනයි මගේ ප්‍රශ්නය.

පසුගිය සතියේ දිනක අනුරාධපුර ආරෝග්‍යශාලාවේ දන්ත වෛද්‍ය අංශය වෙත අනුරාධපුර යුද කඳවුරේ සාජන්ට් කෙනෙකු වන නුර්දීන් නැමැත්තෙකු විසින් රෝගියෙක් ගෙනැවිත් එම රෝගියා වහාම පරීක්ෂා කොට බලා කොළඹ යුද හමුදා ආරෝග්‍යශාලාවට යැවීමට කටයුතු කරන ලෙසට ඉල්ලා තිබෙනවා. අදාල දන්ත වෛද්‍යවරයා එම අවස්ථාවේ දී වෙනත් රෝගියෙක් පරීක්ෂා කරමින් සිටිය නිසා මදක් පමා වන ලෙසට වෛද්‍යවරයා විසින් නුර්දීන් නැමැති යුදහමුදා සාජන්ට් වරයාට දන්වා තිබෙනවා. මෙම අවස්ථාවේ දී මෙම සාජන්ට් වරයා යුද හමුදා නිල ඇඳුම ද ඇඳ සිට නැහැ. තමා ගෙන ආ රෝගියා වහාම පරීක්ෂා නොකිරීම පිළිබඳව උරණ වූ යුද හමුදා සාජන්ට් වර... දන්ත වෛද්‍ය වරයාට අපහාස වන අන්දමින් බැන වැදී තිබෙනවා.

සිවිල් ඇඳුමෙන් සැරසී සිටිය මෙම යුද හමුදා භටයාගේ අත්තෝමතික ක්‍රියාව පිළිබඳව අනුරාධපුර ආරෝග්‍යශාලාවේ දන්ත වෛද්‍යවරු මහත්සේ කැළඹී ඉන්නවා. එමෙන්ම මේ පිළිබඳව රජයේ දන්ත වෛද්‍යවරුන්ගේ සංගමය මගින් 1984. 8. 8 වන දින ගරු සෞඛ්‍ය ඇමතිතුමාට ද කරුණු ඉදිරිපත් කොට තිබෙනවා.

රාජකාරි කටයුතුවල යෙදෙන වෛද්‍යවරුන්ට යුද හමුදා භටයින් විසින් මේ ආකාරයට අපහාස කිරීම හා අයුතු බලපෑම කිසිසේත් සුදුසු නොවන නිසා ගරු සෞඛ්‍ය ඇමතිතුමා මේ පිළිබඳව නොපමාව සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට කටයුතු කරනවාදැයි මා දැන ගන්නට කැමතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

තවත් ප්‍රශ්නයක් අහන්න කල් දී තිබෙනවා නේද ?

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

ඒ ප්‍රශ්නය අහන්නේ නැහැ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය මම අහන්නට බලාපොරොත්තුවන්නේ ගරු වෙළඳ හා නාවික කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙනුයි. මේ ප්‍රශ්නය මම ලිඛිතවත් එතුමාට යවා තිබෙනවා.

1984. 08. 06 වන දින පෙරවරුවේ ශ්‍රී ලංකා රජයේ වානිජ (විවිධ) නීතිගත සංස්ථාවේ සහකාර සාමාන්‍යාධිකාරී (ආරක්ෂක) ගේ කාර්යාලයට පැමිණි එම ආයතනයේ ජාතික සේවක සංගමයේ උප සභාපති ඩබ්ලිව්. දවිත් නැමැත්තෙක් සහකාර සාමාන්‍යාධිකාරීගේ රාජකාරි කටයුතුවලට බාධා කිරීම් සිදු කොට, ඔහුට පහරදීමට තැත් කොට ඇත.

මේ අවස්ථාවේදී තම ආරක්ෂාව සඳහා සහකාර සාමාන්‍යාධිකාරීවරයා දවිත් නමැත්තාව පසෙකට තල්ලු කර දමා ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාට දුරකථනය මගින් පැමිණිලි කොට ඇත. ඉන් අනතුරුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා පොලීසිය කැඳවා මේ සිද්ධිය පිළිබඳව පොලිස් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු යොද තිබේ. ආයතනයේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි නීති නිලධාරීන් විසින් මීට අමතරව මෙම සිද්ධිය පිළිබඳව අභ්‍යන්තර පරීක්ෂණයක් විභාග කොට සහකාර සාමාන්‍යාධිකාරී (ආරක්ෂක) ගේ කටඋත්තරය අඩක් පමණක් සටහන් කර ගෙන පරීක්ෂණය පවත්වමින් සිටියදී ආයතනයේ සභාපතිතුමා විසින් සහකාර සාමාන්‍යාධිකාරී (ආරක්ෂක) ගේ වැඩ තහනම් කරන ලදී. පිළිගත් විනය පරීක්ෂණයට සම්පූර්ණයෙන්ම පටහැනිව සභාපතිතුමාගේ හිතුමනාපය මත සිදු කොට ඇති මේ වැඩ තහනම් කිරීම හේතු කොටගෙන රජයේ වානිජ (විවිධ) නීතිගත සංස්ථාවේ උසස් කාර්ය මණ්ඩලය කැළඹීමට හා භීතියට පත්ව ඇත.

ආයතනයේ සභාපතිතුමා මෙම ක්‍රියා මාර්ගය ගෙන ඇත්තේ ආයතනයේ ජාතික සේවක සංගමයේ මව් සංගම් නිලධාරීන්ගේ බලවත් උසිගැන්වීම නිසා බව පෙනී යයි. වැඩ තහනමට ලක් වී ඇති මෙම සහකාර සාමාන්‍යාධිකාරීවරයා කැපවීමෙන් හා ඉතාමත් අවංකව තම රාජකාරි කටයුතු කරන නිලධාරියෙක් ලෙසට ආයතනය තුළ නමක් දරා සිටී. මෙම නිලධාරියා වෘත්තිය සමිති ශාඛා සභාපතිවරු දෙදෙනෙකුට විරුද්ධව සොරකම් කිරීම් පිළිබඳව පරීක්ෂණ පවත්වා ඇති අතර, ඒ හේතුව කරණකොට ගෙන ඉන් එක් අයෙක් සේවයෙන් ඉල්ලා අස් වී ඇති අතර, අනික් තැනැත්තා සංගමයේ නිලයෙන් ඉල්ලා අස් වී තිබේ. තවද, මෙම නිලධාරියා ජාතික සේවක සංගමයේ වත්මන් ශාඛා සභාපතිට විරුද්ධව පරීක්ෂණ කිපයක්ම පවත්වා ඇති අතර ඉන් එක් චෝදනාවකට වරදකරු වූ ඔහුට සංස්ථාවේ සභාපතිවරයා විසින් 1979. 09. 06 වැනි දින අවසාන අවවාදයක්ද නිකුත් කොට තිබේ. මෙම ශාඛාවේ ලේකම්ට විරුද්ධව ඇති චෝදනා සම්බන්ධයෙන් මෙම නිලධාරියා විසින් පරීක්ෂණ ගණනාවක්ම පවත්වා ඇත. තවද මෙම ශාඛාවේ ප්‍රබල සාමාජිකයින්ට විරුද්ධව මුදල්මය වංචා සම්බන්ධයෙන් හා වෙනත් වංචනික ක්‍රියා සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා ඒ හේතුවෙන් ඒ අය වැඩ තහනමට ලක් වී ඇත. මෙන්න මේ හේතුන් නිසා ජාතික සේවක සංගමය මෙම සහකාර සාමාන්‍යාධිකාරී (ආරක්ෂක) වරයාට ජාතික සේවක සංගමය බලවත් සේ විරුද්ධ වී තිබේ.

රාජකාරි කටයුතු නොපිරිහෙලා ඉටු කරන මෙවැනි උසස් නිලධාරියෙකුගේ සේවය ජාතික සේවක සංගමයේ බලපෑම පිට මෙසේ තහනම් කිරීම ඉතාමත්ම අසාධාරණය. කරුණු මේ ආකාරයට සිදුවුවහොත් අනාගතයේදී රජයේ වානිජ (විවිධ) නීතිගත සංස්ථාවේ කිසිම උසස් නිලධාරියෙකුට තම රාජකාරි කටයුතු අවංකව ඉටු කිරීමට නොහැකි තත්ත්වයක් උදවන්නේය. එම නිසා ගරු ඇමතිතුමා මෙම සිද්ධිය පිළිබඳව අපක්ෂපාතී හා විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන ලෙස මා ඉතාමත්ම ආදරයෙන් එතුමාගෙන් ඉල්ලා සිටින්නට කැමතියි.

මගේ ඊළඟ ප්‍රශ්නය ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා සහ මහවැලි සංවර්ධන ඇමතිතුමාගෙන් ඇසීමටයි. එතුමාගේ නියෝජ්‍ය ඇමතිතුමා පැමිණ සිටින නිසා මම එයින් සෑහීමට පත් වෙනවා. මේ කාරණය මුතුකණ්ඩිය සංවර්ධන ව්‍යාපාරයේ ඉඩම් බෙදදීම සම්බන්ධවයි.

මුතුකණ්ඩිය සංවර්ධන ව්‍යාපාරය ඇරඹීමෙන් ප්‍රදේශයේ විශාල ගොවි පිරිසකට සෙතක් සැලසී ඇති නමුත් ඉඩම් බෙද දීමේදී සිදු වී ඇති යම් යම් අසාධාරණකම් නිසා විශාල පිරිසකට යහපතමං නැතිව ඉතාමත් අසරණ තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වී ඇති බව පෙනේ. පරම්පරාවෙන් මෙම ප්‍රදේශයේ පදිංචිව සිටින සමහරෙකුට ඉඩම් නොලැබී ඇති අතර, අවුරුදු 15-20 පමණ කාලයක් තුළ මෙම ප්‍රදේශයේ වගා කටයුතු කරමින් සිටින තවත් සමහරෙකුට ඉඩම් ලැබී නොමැත. නමුත් මෙම සංවර්ධන ප්‍රදේශයෙන් පිට පදිංචි කිහිප දෙනෙකුටම ඉඩම් ලබා දී ඇති බව දැනගන්නට තිබේ. මෙම ව්‍යාපාරය සාර්ථක කර ගැනීම සඳහා සංවර්ධන ප්‍රදේශය තුළ පදිංචි ගොවියෝ දැඩි බලාපොරොත්තුවකින් සිටිති. එමනිසා සංවර්ධන ප්‍රදේශය තුළ දැනට පදිංචි අයගේ ඉඩම් ප්‍රශ්නය විසඳන තුරු පිට අයට ඉඩම් දීම තාවකාලිකව නතර කිරීමට පියවර ගන්නා මෙන් මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

මා අවසාන වශයෙන් තවත් ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා, ගරු සෞඛ්‍ය ඇමතිතුමාට. අදයි මේ ගැන කල් දුන්නේ මේ ගැන සොයා බලා සුදුස්සක් කරන මෙන් මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. ප්‍රශ්නය මෙයයි : රත්මලානේ කඳවල පාරේ ඇපරල් එක්ස්පෝට්ස් සමාගමේ ඇඟලුම් කම්හලේ සේවකයින්ගේ සෞඛ්‍ය පහසුකම් නොමැති නිසා බෝවෙන රෝග හටගෙන සේවකයින් විශාල පිරිසක් ඉවත් වීම නිසා එහි වැඩ මුර ගණන අඩු කර ඇත. දැනට සේවය කරන අයගේද සෞඛ්‍ය පහසුකම් කිසිවක් නැත. මේ පිළිබඳව පරීක්ෂා කිරීමට යන නිලධාරීන් පාලක පක්ෂය විසින් නොමග යවන බව දැනගන්නට ඇත. මේ පිළිබඳව වහාම පරීක්ෂා කර එහි වැසිකිළිවල තිබෙන අපිරිසිදුතාවය සහ කම්හල් භූමියේ රෝග බෝවීමට ඇති ඉඩකඩ නැති කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලමි.

**ආනන්ද දසනායක මහතා (කොත්මලේ)**
**(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலே)**
**(Mr. Ananda Dassanayake-Kotmale)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමාගෙන් ඇසීමට මා ප්‍රශ්නයක් කල් දී තිබෙනවා. මෙහිදී විශේෂයෙන්ම සඳහන් කරන්නේ උපයන විට ගෙවන බද්ද සම්බන්ධයි. පෞද්ගලික බැංකුවල, කොම්පැණිවල, රජයේ සමහර සංස්ථාවල සහ පුවත්පත් කලාවේදීන් සේවය කරන තැන්වලත් සේවකයන් දහස් ගණනකට වී තිබෙන යම්කිසි හානියක් සම්බන්ධවයි. මේ ප්‍රශ්නය. මේක බරපතල ප්‍රශ්නයක්.

බැංකුවක මැනේජර් කෙනෙකු මට දුන්නා පඩි විස්තරයක්. ඒ අය ලොකු වැටුප් ලබනවාය, ඒ අය හොඳ තත්ත්වයකින් ජීවත් වෙනවාය කියා අපි හිතනවා. මෙන්න පඩි විස්තරය :

| | |
|---|---|
| Basic salary | 2,580 00 |
| C.L.A. | 800 00 |
| Rent Allowance | 920 00 |
| Incharge Allowance | 700 00 |
| Acting Allowance | 577 50 |
| | 5,577 50 |

*Deductions*

| | |
|---|---|
| EPF | 129 00 |
| EPF Loan | 200 00 |
| Staff Loan | 70 00 |
| Loan interest | 68 46 |
| Payee Tax | 763 00 |
| Payee Surcharge 10% | 76 30 |
| Stamp | 50 |
| Union Fees | 3 00 |
| Rehabilitation Tax | 58 88 |
| Housing Loan | 759 18 |
| Total Deduction | 2,128 32 |

The net salary he receives is Rs. 3,449.18.

එතකොට රුපියල් දෙදහස් ගණනක් කපනවා නොයෙකුත් ඒවාට. ඒවායින් විශේෂයෙන්ම රු. 763/=ක් උපයන විට ගෙවීමේ බද්ද වශයෙනුත් සියයට 10ක් රු. 76.30ක් එහි "සර්චාර්ජ් " එක වශයෙනුත් අඩු කරනවා. එතැනම රුපියල් දාහකට කිට්ටු ගණනක් ඒ සේවකයාගේ පඩියෙන් අඩු කරනවා. ආණ්ඩුවේ බදු නිසා ඒ අයට සම්පූර්ණ පඩිය ලැබෙන්නේ නැහැ. මේ සම්බන්ධව ඒ උදවිය යෝජනාවක් කරනවා. පෞද්ගලික කොම්පැනිවලින් විශාල පඩි දෙනවාය කිව්වාට සේවකයන්ගේ අතට ඒ පඩිය ලැබෙන්නෙ නැහැ. එමනිසා ඒ අයගේ ජීවිතය ගෙන යාමට ඉතාම අමාරු තත්ත්වයක් ඇති වී තිබෙනවා. මැනේජර් කෙනෙකු වශයෙන් තත්ත්වය රැක ගන්නට ඕනෑ. සමහර විට වාහනයක් පාවිච්චි කරන්නට වෙනවා. ඒ කිසිවක් කර ගන්නට බැහැ, මේ ලැබෙන මුදලින්. ඒ අඩු කරන මුදල එම කොම්පැනිවලින් හෝ ආයතනවලින් අඩු කරන්නය කියන එකයි, ඒ අයගේ ඉල්ලීම.

කොම්පැණිවලින් මේ 'ටැක්ස්' එක අය කරන්නේ නැහැ. උපයනවිට ගෙවීමේ බද්ද කොම්පැණිවලට භාර දෙන්නට ඕනෑ. කොම්පැණිවලින් සියයට හැත්තෑ පහක් පමණත් සේවකයාගෙන් සියයට විසි පහක් පමණත් අය කරනවා නම් ප්‍රශ්නයක් නැහැ. ගරු මුදල් ඇමතිතුමා වෙනුවෙන් මේ ප්‍රශ්නවලට කවුරු උත්තර දෙන්නට ඉන්නවාද කියන්නට මම දන්නේ නැහැ. මම මේ ප්‍රශ්න අහන්නට දැනුම් දුන්නේ පෙරේදායි. අද ඒවාට උත්තර දෙන්නට කවුරුවත්ම නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන විධියට දුක්ගන්නාරාළ මේවාට උත්තර දෙන්න ඉන්නවාද දන්නේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

ප්‍රශ්නය අහන්න.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

එම නිසා සේවකයන්ගෙන් අය කරන උපයනවිට ගෙවීමේ බද්දෙන් සියයට හැත්තෑ පහක් මේ කොම්පැණිවලින් අය කරන්නටය කියා මම ඉල්ලා සිටිනවා. එහෙම නැත්නම් මේ සේවකයන්ට කවදාවත් සහනයක් ලැබෙන්නේ නැහැ.

ඊළඟ ප්‍රශ්නය ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා සහ මහවැලි සංවර්ධන ඇමතිතුමාගෙන් ඇසීමටයි , මම දැනුම් දී තිබෙන්නේ. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ කොත්මලේ ව්‍යාපාරයේ අනියම් සේවකයින් විසි එක් දෙනෙකුගේ වැඩ නවත්වා ඇති බව ගරු ඇමතිතුමා දන්නවාද ? ඒ වෙනුවට කොන්ත්‍රාත්කරුවන් මාර්ගයෙන් එම වැඩ කිරීමටම අනියම් සේවකයන් බඳවා ගන්නා බව එතුමා දන්නවාද ?

කාලයක් තිස්සේ අනියම් සේවකයන් වශයෙන් මෙම සංස්ථාවේ දුෂ්කර සේවයෙහි යෙදී ඇති අයට, අවුරුදු හතරක් පහක් පමණ සේවය කර ඇති මෙම සේවකයන්ට, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ අනියම් සේවකයන් වශයෙන් තවදුරටත් සේවය කිරීමට අවස්ථාවක් ලබා දෙන්නේද ? එසේ නැත්නම් ඒ ඇයි ?

මේ කාරණය සම්බන්ධයෙන් මට ලිපියකුත් එවා තිබෙනවා. මම එය සම්පූර්ණයෙන් කියවන්නට අදහස් කරන්නේ නැහැ. එහි මුල් කොටස කියවන්නම් :

"ජේ. එම්. ජයසිංහ,
අනියම් සේවක,
6/බී, පා. මා. හරංගල,
හරංගලගම,
නාවලපිටිය.

ගරු මන්ත්‍රීතුමා,
මන්ත්‍රී මණ්ඩල කාර්යාලය,
ශ්‍රී ජයවර්ධන පුරය,
කෝට්ටෙ.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ කොත්මලේ ව්‍යාපාරයේ අනියම් සේවකයින්ගේ සේවා තත්ත්වය පිළිබඳවයි "

මේ සම්බන්ධයෙන් විස්තර සහිතව විසි එක් දෙනෙකුගේ නම් ලැයිස්තුවක් එවා තිබෙනවා. මම ඒ සියල්ලම කියවන්නට යන්නේ නැහැ. මේ උදවිය ඉවත් කිරීම නිසා අද රක්ෂාවක් නැති තත්ත්වයෙන් සිටිනවා. මේක කොන්ත්‍රාත්කරුවන්ගේ උපක්‍රමයක්. කොන්ත්‍රාත්කාරයින් ගහින් ඒ උදවියට ඕනෑ විධියට වැඩ කටයුතු කරගෙන යාම නිසා එහි සේවය කළ සේවකයන්ට අසාධාරණයක් සිදු වී තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේ සිටින නිසා මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා මේ අයට එම සංස්ථාව මඟින්ම රැකියාව කරන්නට ඉඩ ලබා දෙන හැටියට මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

අනික, ටිකක් දිග ප්‍රශ්නයක්. ඒ වාගේම ඉතාමත් වැදගත් ප්‍රශ්නයක්. මෙය ගරු මුදල් ඇමතිතුමාගෙන් අහන්නේ මේ අයට යම්කිසි සහනයක් ලබා ගැනීමටයි. මේ රටේ සාමාන්‍ය ජනතාවට අද බැංකුවලින් ණය මුදල් ලබා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැනීමේදී ඉතාමත්ම අපහසු තත්ත්වයකට මුහුණ දෙන්නට සිදු වී තිබෙනවා. ඊට හේතුව, බැංකුවලින් ණය මුදල් දීම සම්බන්ධයෙන් 1977 දී හෝ ඊට කලින් ගන්නා ලද තීරණයක් විය හැකිය. යම්කිසි පවුලක වාර්ෂික ආදායම රුපියල් දහදහ ඉක්මවන්නේ නම් ඒ අයට මෙම නීතිය අනුව ණයක් ලබා ගන්නට පුලුවන්කමක් නැහැ. මෙය එක් දහස් නවසිය හැට ගණන්වල ඉඳලා එන නීතියක්.

1983 දී මුදල් පනතේ මේ සම්බන්ධයෙන් වූ නීතිරීති වෙනස් කරන්නට කොමිටියක් පත් කර ඒ කොමිටියෙන් වාර්තාවක් සකස් කර තිබෙනවා. නමුත් ඒ වාර්තාව තවමත් ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ කාරණය සම්බන්ධයෙන් මට ලිපි ගණනාවක් එවා තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් නීතිඥ සංගමයෙනුත් වාර්තාවක් එවා තිබෙනවා. එහි ලේකම් මහත්මයාගේ අදහසත් මෙය වෙනස් කළ යුතුය කියන එකයි. ඊකට හේතු වශයෙන් ඒ උදවිය මෙන්න මේ කාරණා පෙන්නා දෙනවා. අද රුපියල් හැත්තෑ පන් දහසක නොවෙයි, රුපියල් ලක්ෂයක වටිනාකමවත් එදා පරණ රුපියල් දහදාහක තත්ත්වයට එන්නේ නැහැ. රුපියල් 10,000 කියන එක දැන් සාමාන්‍ය පවුලක් හම්බ කරන මුදලක්. දෙන්නෙක් හම්බ කරන්න ඉන්න පවුලකට නොයෙක් ක්‍රමවලින් රු. 10,000 හම්බ කරගන්න පුලුවන්. එසේ නම් පරණ රු. 10,000 ක්‍රමයට ආදායම් තත්ත්වය මැනීම වැරදියි. මේ උදවිය දහස් ගණනක් ඉල්ලුම් පත්‍ර යවා තිබෙනවා. ඒවා බොහොමයක්ම ප්‍රතික්ෂේප කර තිබෙනවා. රාජ්‍ය උගස් බැංකුවත්, මහජන බැංකුව, ලංකා බැංකුව ආදී අනෙකුත් බැංකුත් මේ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කර තිබෙනවා. ඒ මොකද ? මේ සියලුම රාජ්‍ය බැංකුවලින් ණය දීමේ සීමාව දමා තිබෙන්නේ රු. 10,000 කට පමණක් නිසයි. අපි 1978 දී ගරු මුදල් ඇමතිතුමාට කරුණු ඉදිරිපත් කළ වෙලාවෙත් පොරොන්දුවක් දී තිබෙනවා මේ නීතිය වෙනස් කරනවාය කියා. ඊට පස්සෙ කොමිටියක් පත් කර ඒ කොමිටියේ වාර්තාව සකස් කර තිබුණත් මා හිතන්නෙ තවමත් එය පිට කර නැහැ.

මේ උදවිය ඉල්ලා සිටින්නේ මේ සීමාව රු. 75,000 දක්වා වැඩි කරන්න කියලයි. ඊළඟට දෙවනි කාරණය දැන් ආදායම් බදු ක්‍රමයේ තිබෙන විධියට එක එක්කෙනාගේ ආදායම වෙන වෙනම මැනීමයි. එතකොට ඒ ගොල්ලන්ට ඊකෙන් නිදහසක් තිබෙනවා. පවුලේ සියලු දෙනාගේම ආදායම් තත්ත්වය එකට බලා රු 10,000 ට වැඩි නම් දෙන්නේ නැහැ. ඊක වැරදියි. එහෙම නම් රු. 10,000 සීමා කරන්න ඕනෑ, එක එක්කෙනාට. එතකොට පවුලෙ පස් දෙනකු සිටියොත් රු. 50,000 ක් පමණ සීමාව යන්න පුළුවන්, හත් දෙනක් සිටියොත් රු. 70,000 ක් පමණ පුළුවන්.

අපි විශේෂයෙන්ම කියන්නේ රුපියල බාල්දු වීම නිසා අද රුපියලේ වටිනාකම ශත 10 කට 15 කට කිට්ටු වටිනාකමකයි තිබෙන්නෙ. එහෙම නම් ඒ අනුව මැන බැලුවම සීමාව රු. 1,50,000 ක් පමණ වෙන්න ඕනෑ. ඒ නිසා එද රු. 10,000 ණය දීමේ සීමාව අද රු. 1,50,000 දක්වා දීර්ඝ කරන්න ඕනෑ. නමුත් ඒ අය රු. 1,50,000 ක් ඉල්ලන්නෙ නැහැ. ඒ අය ඉල්ලන්නෙ රු. 75,000 ක්වත් කළ යුතුය කියලයි.

ගරු මුදල් ඇමතිතුමා මේ සඳහා උත්තරයක් එවා තිබෙනවාද කියා මම දන්නෙ නැහැ. මම දවස් තුනකට ඉස්සෙල්ලයි කල් දුන්නෙ. කෙසේ වෙතත් මට එවා තිබෙන ඒ ලිපිවල ජායා පිටපත්වල මාතෘකා පමණක් මම කියවන්නම්. පළමුවෙනි කරුණය මේකයි :

This is from the original Finance Act No. 11 of 1963.

"For the purposes of sub-paragraph (i) of paragraph (*c*) of this subsection, 'member of the family', when used in relation to any person, means the spouse of that person or any son or daughter of that person over eighteen years of age, or any parent, brother or sister dependent on that person."

ඒ කියන්නේ ඒ සියලු දෙනාගේම මුදල් තම තමන්ට අයිති වෙනවා වයස 18 ට වැඩිනම්. ඒ ගොල්ලන්ගේ මුළු ආදායමම ගණන් බලනවා. ඊක වැරදිය කියන එකයි මේ අය පෙන්වා දෙන්නෙ.

ඊළඟට ඊකෙම "බී" කොටස :

"(*b*) unless the Bank is satisfied that the average statutory income of the person making the application and of the other members of the family of which he is the head, computed under the provisions of the written law relating to the imposition of income tax, for the three years of assessment immediately preceding the date on which such application was made by him, does not exceed a sum of ten thousand rupees ; or"

මේකයි එතැන වෙනස් කරන්න තිබෙන්නෙ. මෙය 1983 සකස් කළ නීතිය. එයමයි අදටත් බල පවත්වන්නෙ. ඒ නිසා මේ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනවා. දහස් ගණනක් යැවූ ඉල්ලුම්පත්‍රවලින් ඉල්ලුම් පත්‍ර 5 කට වඩා අනුමත වී නැහැ. ඒ නිසා සැහෙන අසහනයක් තිබෙනවා. මේ පිළිබඳව මහජන මතයක් සකස් වී තිබෙනවා. 1983 නොවැම්බර් මාසෙ 7 වෙනිදා සඳුදා "දවස" පත්‍රයේ "පාඨක ප්‍රකාශ" යටතේ මෙසේ පළ වී තිබෙනවා :

"මහජන බැංකුව යනු මහජනතාවගේ යහපත උදෙසාම පිහිටුවා ඇති ආයතනයක් බව මහජනතාව පිළිගෙන ඇත. එහෙත් එහි පිහිටුවා ඇති ඉඩම් බේරුම් කිරීමේ අංශයේ ඇතැම් පැරැණි නීති රීති නිසා මහජනතාවට විවිධ දුෂ්කරතාවනටද මුහුණ පෑමට සිදුවන බව පෙනේ.

මෙම අංශය 1973 සම්මතවූ මුදල් පනත යටතේ පිහිටුවා ඇති එකකි. එම පනත යටතේ යම් කෙනෙකුගේ හෝ ඔහුගේ පවුලේ සාමාජිකයන් ගේ වාර්ෂික ආදායම රුපියල් දහදාහ ඉක්මවන්නේ නම් එවැනි අයෙකුට සහනයක් පතා අයදුම් පතක් හෝ ඉදිරිපත් කිරීමේ අවස්ථාව අහිමි වන බවට එක් කොන්දේසියක් ඇත.

මේ තත්වය 1973 ට ගැලපෙන්නට ඇත. නමුත් අද මුදලේ අගය එදාමෙන් දස ගුණයකින් පමණ වෙනස් වී ඇත. එද රු. 10 අද රු. 100 ටත් අසමානවන තරමට අගය අඩුවී ඇත. එසේම බස් ගාස්තු, රේගු ගාස්තු, මුද්දර ගාස්තු, දඩ මුදල් ව්‍යවස්ථාව ආදිය කාලානුරූපව වෙනස්වී ඇත."

ඊකෙනුත් කියන්නෙ වහාම මෙහි ආදයම් සීමාව රුපියල් 10,000 සිට 75,000 දක්වාවත් වැඩි කළයුතුව ඇත කියන එකයි.

මම මේවා සම්පූර්ණයෙන් කියවන්නෙ නැහැ, කොටස් වශයෙනුයි කියවන්නෙ. ඊළඟට මෙන්න :

"THE SUNDAY OBSERVER OCTOBER 16, 1983 MAIL BAG – Finance Act of 1973

"Articles have appeared in the press from time to time requesting the authorities to amend the Finance Act of 1973 in order to remove some of its outdated clauses and requirements. One such requirement is that whoever tenders an application for relief is unqualified if his annual statutory income including that of his wife or the other members of the family exeeds Rs. 10,000/- per year. This was in 1973."

ඊළඟට මේ තව එකක් :

"DAILY NEWS, FRIDAY AUGUST 19, 1983

Letters to the Editor–Finance Act

"When this Act was enacted a specific clause was incorporated, that the annual statutory income of the applicant, his wife and family members should be less than Rs. 10,000."

එයිනුත් ඉල්ලන්නෙ ඊක වෙනස් කරන්න කියලයි. ඊළඟට : 1983

"1983 අගෝස්තු මස 30 වෙනි අඟහරුවාදා "දවස"

මේ ආඥ පනත කලට උචිත පරිදි වෙනස් විය යුතුයි"

තවදුරටත් එහි මෙසේ තිබෙනවා :

"එම මුදල් ආඥ පනතේ සදහන් රු. 10,000 වාර්ෂික ව්‍යවස්ථා ආදායම් සීමාව අදට ගැලපෙන අයුරින් රු. 75,000 දක්වා හෝ වැඩිකර එම වැඩිවීම 1977 දක්වා පමණ අතීතයට බලපාන අන්දමින් සංශෝධනය කිරීමට මහජන බැංකුව මුදල් අමාත්‍යාංශය හා රජයේ සෙසු බලධාරීන්ගේ කාරුණික අවධානය යොමු වන්නේ නම් එමගින් සැලසෙන සහනය දුක්විඳින කම්කරු ජනතාව වෙත පිදෙන මිණි කිරුලක් වනු නොඅනුමානය.

එස්. එම්. සිරිපාල, 89, උසාවිය පාර, මැදකොළඹ"

තවත් දෙකක් තිබෙනවා. මම 'හෙඩිංස්' පමණයි කියවන්නෙ :

"දිවයින ඉරිදා සංග්‍රහය

ජනහමුව

1983 ජූලි මස 3 වැනි ඉරිදා

උකස් බැංකුවේ හණ මිටියක්

" අද දක්වාම එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන නමුත් රුපියල් 10,000 සීමාවද එසේම පවතී. 1973 වර්ෂයේ ක්‍රියාත්මක කළ මෙවැනි සීමාවක් අද දක්වාත් එසේම පැවතීම තේරුම් ගැනීමට අපහසු දෙයකි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

මුදලේ අගය අද කෙතරම් වෙනස්වී තිබේද ? රුපියල් 10,000 සීමාව හාස්‍යයට ලක්විය යුතු තරම් දෙයකි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට :

"දිනමිණ වර්ෂ 1983 ක්වූ ජූනි මස 29 වැනි බදාදා
මහජන බැංකුවෙන් සහන සලසන්න"

"1969 මුදල් ආඥපනත යටතේ එවකට පැවැති මූල්‍ය තත්ත්වය අනුව තමා හා තම පවුලේ බිරිය දරු දූරියන්ගේ වාර්ෂික ව්‍යවස්ථ ආදයම රුපියල් 10,000 කට වැඩි වුවහොත් කොතෙක් උත්සාහ දරුවද යම් යම් අඩු පාඩුකම් මැද තම ශ්‍රමය කාලය ධනය සාමූහිකව වැය කර තැනූ නිවසින් පිටවී මහ මඟට බැසීමට සිදුවේ"

මේ අත්දමට නොයෙක් විට කරුණු කියා තිබෙනවා. මුදල් අමාත්‍යාංශයට අපි මේ ප්‍රශ්නය ඉදිරිපත් කලේ ඉතාමත්ම වැදගත් ප්‍රශ්නයක් හැටියටයි. සාමාන්‍ය ජනතාවට මේ තිබෙන තත්ත්වය නිසා ලොකු හානියක් වෙනවා. ඒ මන්ද මේ රුපියල් දහදහක සීමාව තිබෙන නිසා ඊට අඩු ආදයම් ලබන අයගේ ඒවා පමණයි භාරගන්නේ. අනික් ඒවා ප්‍රතික්ෂේප කරනවා. ඒ නිසා මේ ගැන මුදල් අමාත්‍යාංශයෙන් සකස් කෙරුණු වාර්තාව පිටකර, මුදල් පනතේ ඒ වගන්ති වෙනස් කර සහනයක් සලසන හැටියට මම ඉල්ලා සිටිනවා.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසීම සඳහා මා ප්‍රශ්නයක් කල් දී තිබෙනවා. මද්‍රාසි ගුවන් තොටුපොළේ සිදු වූ බෝම්බ පිපිරීම සම්බන්ධයෙන් අගෝස්තු 07 වැනිද විදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කලා. ඒ ගුවන් තොටුපොළේ සිටි ශ්‍රී ලාංකිකයන් 31 දෙනාගෙන් 24 දෙනෙක් ජීවිතක්ෂයට පත් වුණා. මා දන්නා විධියට ඉතිරි 7 දෙනාගෙන් දෙදෙනෙක් පමණක් ආපසු ලංකාවට ඇවිත් තිබෙනවා. අනෙක් අය බොහෝම අසාධ්‍ය තත්ත්වයෙන් මද්‍රාසි රෝහලේ දැනට ප්‍රතිකාර ලබමින් සිටිනවා. ඒ අතර එම බෝම්බ පිපිරීමෙන් අනාථ වූ පවුල්වලට රුපියල් ලක්ෂය බැගින් වන්දි ගෙවන්න ජනාධිපතිතුමා තීරණය කර තිබෙනවා.

විශේෂයෙන් මා මේ ප්‍රශ්නය නඟන්නේ ඊට අමතරව ලබා දිය යුතු වන්දි මුදලක් සම්බන්ධයෙනුයි. ජාත්‍යන්තර ගුවන් සේවා සම්මුතීන්ට අනුව සෑම ගුවන් සේවාවක්ම බැඳී සිටිනවා, තමන් මඟීන් ගන්නා තැන සිට අවසානයේ ඒ මඟීන් ගොඩබාන තැන දක්වා ඔවුන් රක්ෂණය කරන්න.

මේ ශ්‍රී ලාංකිකයන් ගමන් කර තිබෙන්නේ 'Indian Air Lines සේවයට අයත් ගුවන් යානයකිනුයි. නමුත් 'Indian Air Lines' සේවයේ බලපත්‍ර—'tickets'—නොවෙයි, 'Air India' සමාගමේ බලපත්‍ර ඇතිවයි, ගමන් කර තිබෙන්නේ. 'Air India' සමාගමේ ගුවන් යානා කොළඹට එන්නේ නැති නිසයි, "Indian Air Lines" සේවයේ ගුවන් යානයකින් කොළඹ සිට මද්‍රාසියට ගිහින් තිබෙන්නේ. කොළඹ සිට මද්‍රාසියටත්, එතැනින් බොම්බායටත් ගිහින් බොම්බායේදී මැදපෙරදිග බලා යන ගුවන් යානයකට නඟින්නයි, කටයුතු සැලසුම් කර තිබෙන්නේ. ඒ විධියට තමයි, මැදපෙරදිගට ගිහින් තමන්ගේ පවුල් නඩත්තු කිරීම සඳහා ආදයම් මාර්ගයක් ලබා ගන්න ඒ අය බලාපොරොත්තු වී තිබෙන්නේ.

එමනිසා, මා කලින් සඳහන් කළ, ඒ ගුවන් යානා මඟීන් පිළිබඳ රක්ෂණය අනුව මේ අනතුරට පත් අයට, එහෙම නැත්නම් ඔවුන්ගේ පවුල්වල අයට ලැබිය යුතු වන්දි මුදල් ලබා දීම පිළිබඳව විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ක්‍රියා කළ යුතුව තිබෙනවා. මා කල් දී තිබෙන ප්‍රශ්නය මෙයයි :

1984 අගෝස්තු 02 දින කටුනායක ගුවන් තොටුපළින් ඉන්දියන් එයාර් ලයින්ස් ගුවන් යානයකින් මද්‍රාසියට ගොස් තව ඉදිරියට මැදපෙරදිගට ගමන් කිරීමට බලා සිටිය දී :

(1) මද්‍රාසි ගුවන් තොටුපළේ දී ඇති වූ පිපිරීමකින් මිය ගිය ශ්‍රී ලාංකිකයන්ට ඉන්දියන් එයාර් ලයින්ස්' සේවය විසින් ගෙවිය යුතු වන්දි ඒ පවුල්වල අයට ලබා දීමට රජය කටයුතු කර තිබේද, නැතහොත් කටයුතු කිරීමට ක්‍රියා කරනවාද ?

(2) එකී ගමනින් අනතුරට පත්, ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට හිමි වන්දි ගුවන් සමාගමින් ලබා දීමට ක්‍රියා කරනවාද ?

ඒ බෝම්බ පිපිරීමෙන් ජීවිතක්ෂයට පත් නොවී බේරුණු අය සමහර විට තමන්ගේ ඉතිරි මුළු ජීවිත කාලයටම රක්ෂාවක් කරන්න බැරි තත්ත්වයකට පත්වෙලා ඇති. ජනාධිපතිතුමාගේ ප්‍රකාශය අනුව, එතුමා දෙන වන්දි මුදල ඒ ජීවත්ව ඉන්න අයට ලැබෙන්නේත් නැහැ. අර ගුවන් මඟී රක්ෂණය අනුව ඒ අයට ලැබිය යුතු වන්දි මුදල ලබා දෙනවා නම් ඉදිරි කාලය තුළ යම්කිසි ආදයම් මාර්ගයක් සකස් කර ගැනීමට හෝ ඒ මුදල යොදා ගන්න ඒ අයට පුළුවන්කම ලැබෙනවා. ඒ ජාත්‍යන්තර ගුවන් සේවා සම්මුතීන් පිළිබඳව එකඟත්වයට පැමිණ ඇති සෑම ගුවන් සේවාවකම අනිවාර්ය යුතුකමක්, නිසි පරිදි ඒ වන්දි මුදල් ගෙවීම.

එම නිසා මේ සම්බන්ධයෙන් විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මැදිහත් වී, අදාළ රටවල සිටින අපේ තානාපතිවරුනුත් සහභාගි කරවාගෙන අවශ්‍ය කටයුතු කර—ඒ බෝම්බ පිපිරීමෙන් අනාථ වුණු පවුල්වලට රජය ගෙවන වන්දි මුදලට අතිරේකව—ලැබිය යුතු ඒ රක්ෂණ වන්දි මුදල් ඒ අයට ලබා දීමට කටයුතු කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. ඒ රක්ෂණ වන්දි මුදල ජීවිතක්ෂයට පත් වූවන්ගේ යැපෙන්නන්ට පමණක් නොව බෝම්බ පිපිරීමෙන් අනතුරට පත්ව දැනට ජීවත්ව සිටින අයටත් ලබා දීමට අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ.

ඒ බෝම්බ පිපිරීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා අපේ රජය තවම පරීක්ෂණ කමිටුවක් පත් කර නැහැ. එම නිසා ඒ පිළිබඳවත් වහාම අවශ්‍ය පියවර ගන්නය කියා විදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගුවන් සේවය මීට වගකිවයුතුද නැද්ද කියන ප්‍රශ්නය අනාගතයේදීත් මතු වෙන්න පුළුවනි. එම නිසා හිටපු විනිශ්චයකාරවරුන්, රාජ්‍ය තන්ත්‍රයේ උසස් නිලධාරීන් ආදීන්ගෙන් සමන්විත විමර්ශන කමිටුවක් මේ සම්බන්ධයෙන් පත් කොට ඒ සිදු වූ අනතුර සම්බන්ධයෙන් සම්පූර්ණ පරීක්ෂණයක් පැවැත්වීම ශ්‍රී ලංකා රජයේ යුතුකමක්. ඒ කටයුත්ත කිරීමට ඉදිරිපත් වන්නය කියා මේ අවස්ථාවේදී විදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාට මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට අද දින මෙම ගරු සභාවේ සිටින්නට අමාරුය කියලා මට දැනුම් දුන්නා. නමුත් ඊළඟ සභා රැස්වීමේදී මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නට බලාපොරොත්තු වන නිසා මම මෙම ප්‍රශ්නය ඉදිරිපත් කලා. මේ කාරණය අද රටේ පවතින තත්ත්වයටත්, ශ්‍රී ලංකාවේ ජනතාවගේ අයිතිවාසිකම්වලටත්, අපේ ලාංකිකයන් අනාගතයේදී පත්විය හැකි ඉරණම් පිළිබඳවත් සැහෙන වගකීමක් ඉටුකිරීමක් වෙනවා. එම නිසයි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කලේ.

ඊට අමතරව, අවසාන වශයෙන් තව එක කාරණයක් කිවයුතුව තිබෙනවා. ගරු කම්කරු ඇමතිතුමාත් මේ ගැන තමන්ගේ දැඩි අවධානය යොමු කලයුතු අවස්ථාවට දැන් පැමිණ තිබෙනවා. ලංකාවෙන් විදේශීය රැකියාවන් සඳහා පිටරට යවන අය, කෝච්චි පෙට්ටිවලට පටවනවා වගේ හිටි හැටියේ පටවා යවන ප්‍රතිපත්තිය නවත්වලා තම අමාත්‍යාංශය හා ලියාපදිංචි වී ඇති සමාගම් මේ සම්බන්ධයෙන් යම්කිසි පිළිවෙතක් අනුගමනය කලයුතුයි. යවන්නට පුළුවන් ගමන් මාර්ගයන් හා යන්නේ කොහොමද ආදී වශයෙන් තීරණය කර ගැනීමට කම්කරු අමාත්‍යාංශයේ අවධානය යොමු කලයුතුයි. කම්කරු අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් පියවර ගන්නවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මම නවතිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

Hon. Prime Minister's reply.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
(Mr. M. Vincent Perera)

The first question was raised by the hon. Member for Matugama in regard to the roads in the Matugama electorate.

As far as roads belonging to the Department of Highways are concerned special allocations amounting to Rs. 1,039,500 have been given by the Director of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Highways to Chief Engineer, Highways, Kalutara, for 13 items of work in the Matugama Electorate relating to the repair of flood and earth-slip damage as well as the prevention of further damage of the road surface as a result of the extremely heavy spell of rain experienced recently. (a list of these items is tabled)*

* සභා මේසය මත තබන ලද ලැයිස්තුව :
இணைக்கப்பட்ட நிரல் :
*List tabled.*

MATUGAMA ELECTORATE (AGALAWATTE E.E's DIVISION)

Special allocations given by the Director of Highways for the repair of flood and earth-slip damage and the protection of the road surface from further damage.

| | *Alocation Rs.* | *Present position* |
|---|---|---|
| 1. Widening and redecking culvert 5/1 on Alutgamweediya – Yatadolawatte Road | 30,000 | Complete |
| 2. Reconstruction of Centre Pier and repairs to Bridge 3/8 on Matugama-Manana-Bopitiya Road | 250,000 | 50% complete |
| 3. Strengthening and repairing of deck of bridge 20/1 on Aluthgama-Horana Road | 30,000 | Complete |
| 4. Remetalling and 1st coat tarring 6th and 7th miles of Nagoda-Kalawellawa-Bellapitiya Road. | 100,000 | Complete |
| 5. Remetalling and 1st coat tarring on 3rd, 4th, 5th and 6th miles of Palatota-Kethhena Road | 100.000 | 40% complete (metal piled) |
| 6. Bitumen surfacing 2nd coat on 27th and 30th miles of Horana-Aluthgamam Road | 4,500 | Complete |
| 7. Bitumen surfacing 2nd coat on 2nd mile of Nagoda – Kalawellawa-Bellapitiya Road | 20,000 | Complete |
| 8. Clearing of earth slips on 11th mile on Katukurunda–Neboda Road at Neboda junction | 47,000 | Complete |
| 9. Clearing road block due to earthslip on 4th mile Girikola – Helambe Road | 18,000 | Complete |
| 10. Filling of washaways and resurfacing damaged sections on 22nd mile between culverts 22/1 and 22/3 on Horana – Aluthgama Road | 30,000 | Work not started |
| 11. Filling back washaway sections on road platform on 11th mile and 14th mile of Nagoda – Kalawellawa-Bellapitiya Road | 60.000 | Work not started |
| 12. Bitumen surfacing 2nd coat on sections of 3rd, 4th and 5th miles of Nagoda-Kalawellawa – Bellapitiya Road | 200.000 | Work not started |
| 13. Bitumen surfacing 2nd coat on 24th, 25th and 26th miles of Horana – Aluthgama Road | 150.000 | Work not started |
| | 1,039,500 | |

If the hon. Member feels that the work is unsatisfactory he can bring it to the notice of the Hon. Prime Minister. He will take action.

Then the second question was with regard to betting centres.

Any institution carrying on betting has to obtain a licence under the Licencing of Clubs Law No. 17 of 1975 from the local authority of the area who will issue it in consultation with the police and the Excise Commissioner. If any institution is carying on betting without a proper licence, the information can be given to the proper authority for appropriate action.

As regards paragraph 2 of the question, it is reported by the police that places carrying on such nefarious activities are being frequently raided and are brought to book. YATARO is no exception to the requirements of the law.–(*Interruption*). But it is not an exception to the requirements of the law.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

The point is, the Government policy is to allow beting where they have obtained licences. That seems to be the policy.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரோரா)
(Mr. M. Vincent Perera)

That has been the policy existing from 1975.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

No, but no licences were issued. Administratively, no licences were issued.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரோரா)
(Mr. M. Vincent Perera)

But that is a matter for the local authority. Local authorities are issuing licences–(*Interruption*).

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please ! You have replied the question.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 11.33

**චන්ද්‍රා ගන්කන්ද මහතා (වැඩ බලන සෞඛ්‍ය ඇමතිතුමා)**
**(திரு. சந்திர கண்கந்த — பதில் சுகாதார அமைச்சர்)**
(Mr. Chandra Gankanda– Acting Minister of Health)

යාපහුව ගරු මන්ත්‍රීතුමා (එච්. බී. අබේරත්න මහතා) ප්‍රශ්නයක් නැගුවා. ඒ පිළිබඳව විස්තරාත්මකව පරීක්ෂණයක් පැවැත්විය යුතු බැවින් අදාළ බලධාරීන්ගේ සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සඳහා මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට කල් ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) නැගූ ප්‍රශ්නයට පිළිතුරු මම ඉදිරිපත් කරනවා. 1984 අගෝස්තු මස 04 වන සෙනසුරාද පෙ. ව. 10.30 ට පමණ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් රෝගීන් පරීක්ෂා කරමින් සිටින අවස්ථාවේදී සිවිල් ඇඳුමින් සැරසුණු යුද හමුද නිලධාරීන් දෙදෙනෙක් දන්ත සායනය තුලට පැමිණ ඔවුන්ගෙන් එක් අයෙකුගේ දතක්, අනුරාධපුර රෝහලේ දන්ත ශල්‍ය වෛද්‍යවරයා විසින් 3 වන සිකුරාද ඉගිලීමෙන් පසුව මුහුණේ ඇති වූ ඉදිමුමක් නිසා ඔහු කොළඹ යුද හමුද දන්ත ශල්‍ය වෛද්‍යවරයා වෙත යොමු කරන ලෙසට ඉල්ලා සිටියහ. රෝගියා සමග පැමිණි එක් අයකු යුද හමුදවේ හෙදවරයෙකු වූ සැරයන් නූර්දීන් බවට හඳුනා ගන්නා ලදී. දන්ත ශල්‍ය වෛද්‍ය සිවඥනම් මහතා රෝගියෙකු පරීක්ෂා කරමින් සිටියදී ඔහු එතැනට පැමිණ යොමු පත්‍රය (රෙපරල් කාඩ්) යුද හමුද දන්ත ශල්‍ය වෛද්‍යවරයා වෙතට ඉදිරිපත් කිරීම පිණිස ඉක්මණින් අනුමත කර දෙන ලෙසට ඉල්ලා ඇත. ඒ අවස්ථාවේදී දන්ත ශල්‍ය පුටුවේ වාඩිවී සිටි රෝගියා පරීක්ෂා කරන තෙක් මොහොතක් ප්‍රමාද වෙන ලෙසට සැරයන් නූර්දීන්ගෙන් දන්ත ශල්‍ය වෛද්‍යවරයා ඉල්ලා ඇති බවට වාර්තා වී ඇත. ඒ අවස්ථාවේදී සැරයන් නූර්දීන් දන්ත ශල්‍ය වෛද්‍යවරයාහට බැණ වැදී උඩු මහලේ වෛද්‍ය අධිකාරීගේ කාර්යාලයට ගිය බව කියනු ලැබේ. එහිදී යොමු පත්‍රය යුද හමුද දන්ත ශල්‍ය වෛද්‍යවරයාට ඉදිරිපත් කරන ලෙසට සැරයන් නූර්දීන් විසින් වෛද්‍ය අධිකාරීගෙන් ඉල්ලා ඇත. මේ අතරතුර දන්ත ශල්‍ය වෛද්‍යවරුන් විසින් වෛද්‍ය අධිකාරීට දුරකථනය මගින් මෙම සිද්ධිය පිළිබඳව දන්වා ඇත. තවදුරටත් මේ සම්බන්ධයෙන් ඇතිවිය හැකි කලබල මැඩ පැවැත්වීමේ අදහසින් වෛද්‍ය අධිකාරී විසින් එම පත්‍රය යුද හමුද දන්ත ශල්‍ය වෛද්‍යවරු වෙතට යොමු කර ඇත. ඒ සමගම දන්ත සායනයේ ඇති වූ, සිද්ධිය ගැන පැමිණිලි කිරීමට දන්ත ශල්‍ය වෛද්‍යවරු වෛද්‍ය අධිකාරී කාර්යාලයට පැමිණ ඇත. එවිට යුද හමුද නිලධාරීන් වෛද්‍ය අධිකාරී කාර්යාලයෙන් පිටව ගොස් නැවතත් දන්ත සායනයට පැමිණ, " අපි දන්ත ශල්‍ය වෛද්‍යවරුන් ගැන බලාගන්නම් " යනුවෙන් කාර්ය මංඩලයට තර්ජනය කොට පිටව ගොස් ඇත.

දන්ත ශල්‍ය වෛද්‍යවරු ශාරීරික පීඩා සිදුවෙතැයි යන බියෙන් දන්ත සායනයේ රාජකාරි කිරීම ප්‍රතික්ෂේප කොට ඇත. ලැබී ඇති තොරතුරු අනුව, වෛද්‍ය අධිකාරී විසින් ප්‍රාදේශීය යුද හමුද අණදෙන නිලධාරී කර්නල් අසෝක ජයවර්ධන මහතා අමතා මේ බව දන්වන ලදුව, ඔහු පෞද්ගලිකවම එහි පැමිණ උදය වරුවේ ඇති වූ සිද්ධිය පිළිබඳව වෛද්‍ය අධිකාරී ඉදිරිපිට දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගෙන් සමාව අයැද ඇත.

ගරු අත්තනගල්ල මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) නැගූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් කිවයුතුව තිබෙන්නේ, ඒ පිළිබඳව පරීක්ෂා කර බලා අදාල නිලධාරීන්ට ඒ සම්බන්ධව උපදෙස් දෙන්නට ක්‍රියා කරන බවයි.

**එම්. එස්. අමරසිරි මහතා ( වෙළඳ හා නාවුක කටයුතු පිළිබඳ ඇමතිතුමා)**
**(திரு. எம். எஸ். அமரசிறி — வர்த்தக, கப்பற்றுறை அமைச்சர்)**
(Mr. M. S. Amarasiri Minister of Trade & Shipping)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1984.08.06 වන දින පෙරවරුවේ ශ්‍රී ලංකා රජයේ වාණිජ නීතිගත සංස්ථාවේ සිදු වී ඇති යම්කිසි සිද්ධියක් පිළිබඳව සහකාර සාමාන්‍යාධිකාරීවරයාගේ වැඩ තහනම් කිරීම ගැන අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ප්‍රශ්නයක් ඉදිරිපත් කර තිබෙනවා.

ඔහුගේ වැඩ තහනම් කිරීම කාගේවත් බලපෑමක් හෝ උසි ගැන්වීමක් උඩ සිදු වූවක් නොවෙයි. විනය කඩ කිරීමක් පිළිබඳව බැලූ බැල්මට පෙනී ගිය නිසා සභාපතිවරයා විසින් නිසි ක්‍රියාමාර්ගයක් ගෙන තිබෙනවා. මේ ගැන දැන් පරීක්ෂණයක් පැවැත්වෙනවා. එම පරීක්ෂණය පැවැත්වෙන නිසා මේ ගැන වැඩි විස්තර කියන්නට මම කැමති නැහැ. සභාපතිවරයා නිසි පරිදි ඒ ගැන කටයුතු කරනවා ඇති.

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

The reply to the question asked by the hon. Member for Attanagalla from the Hon. Minister of Lands and Land Development and Minister of Mahaweli Development.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
(Mr. M. Vincent Perera)

I want to know from the hon. Member for Kotmale whether he was referring to the Muthukandiya–

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

No, no, I am referring to it.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
(Mr. M. Vincent Perera)

Then, I will reply.

මුතුකණ්ඩිය සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කර ඇත්තේ ප්‍රදේශයේ ගොවීනට සෙතක් සැලසීම සඳහා පමණක් නොව වගාව සඳහා ඉඩම් නොමැති පන්තියේ පුද්ගලයන්ට වාරිමාර්ග පහසුකම් සහිත ඉඩම් ලබා දීම සඳහාද වූ ජාතික ව්‍යාපාරයක් වශයෙනි. කෙසේ වුවද, ව්‍යාපාරය ආරම්භ කරන අවස්ථාවේදී එම ප්‍රදේශය තුළ පදිංචිව සිටි ගොවි පවුල්වලින් සියයට 55 කටත් වැඩි ප්‍රමාණයකට ව්‍යාපාරය යටතේ ඉඩම් ලබා දී තිබේ. ඉතිරි සියයට 5 කටත් අඩු ප්‍රමාණයකට ඉඩම් ලබා දී නොමැත්තේ ඔවුනට රජයේ රැකියා හා වෙළඳාම වැනි වෙනත් ආදායම් මාර්ගවලින් වර්ෂයකට රු. 15,000 කටත් වැඩි ආදායම් ලැබෙමින් පවතින හෙයිනි. ඔවුන් දැනට පදිංචිව සිටින හෝ ව්‍යාපාර පවත්වාගෙන යන ස්ථිර ගොඩනැගිලි තවදුරටත් ඔවුන් සතුව පැවැතීම සඳහා ඒවා ව්‍යාපාර බල ප්‍රදේශය තුලට ඇතුලත් කරගෙන නොමැත. තාවකාලික නිවාස තිබුණු අයට නව නිවාස ඉදි කර ගැනීම සඳහා වෙනම ඉඩම් වෙන් කර දී තිබේ. මේ අනුව ව්‍යාපාරය ආරම්භ කරන අවස්ථාවේ එම ප්‍රදේශයේ සිටි කිසිදු ගොවි පවුලකට යන එන මං නැති වීමේ තත්ත්වයක් උදා වී නොමැත. එවැන්නක් පිළිබඳ නිශ්චිත තොරතුරු සපයන්නේ නම් තවදුරටත් සොයා බැලිය හැකිය.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

එවැන්නක් පිළිබඳ තොරතුරු රාශියක් මට ලැබී තිබෙනවා. මේ සම්බන්ධයෙන් සියඹලාණ්ඩුව, අම්පාරේ හන්දියේ, මුතුකණ්ඩිය පිළිසරණ සමිතියේ ලේකම් විසින් එවන ලද ලිපිය මම සභාගත කරන්නම් * එහි කර තිබෙන ඉල්ලීම අනුව ගොවි පවුල් තිහකටම අසාධාරණයක් වී තිබෙන බව පැහැදිලි වන නිසා ගරු ඇමතිතුමා එය කියවා බලා ඉඩම් නැති ඒ ගොවි පවුල්වලට ඉඩම් ලබා දීමට කටයුතු සැලසුවොත් එතුමාට පින් සිදු වෙනවා.

* පුස්තකාලයේ තබා ඇත.
நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.
*Placed in the Library.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

The question by the hon. Member for Kotmale with regard to the employees of the State Development and Construction Corporation.

එම්. එල්. එම්. අබුසාලි මහතා (නියෝජ්‍ය මහවැලි සංවර්ධන ඇමතිතුමා)
(ஜனாப் எம். எல். எம். அபூசாலி — மகாவலி அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(Mr. M. L. M. Aboosally–Deputy Minister of Mahaweli Development)

I will answer that question. This question asked by the hon. Member for Kotmale (Mr. Ananda Dassanayake) is regarding the employees of the SD & CC. Although they do not come directly under the Mahaweli Ministry, yet the SD & CC is doing some work for the Mahaweli Ministry. They are doing the peripheral roads and, as the hon. Member knows, we are finishing the Kotmale work ahead of schedule. Actually the inundation will take place in the course of this year. As the work finishes we discontinue the casual labour, but in this case as the hon. Member said that other employees from contractors are been taken in, we are going into this matter, and I can assure the hon. Member –

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

I mean the sub-contractors are there to do the work.

එම්. එල්. එම්. අබුසාලි මහතා
(ஜனாப் எம். எல். எம். அபூசாலி)
(Mr. M. L. M. Aboosally)

We are also giving work to the sub-contractors from the SD & CC. We are discontinuing these employees because there is a law which states that casual employees can be employed for six months, and then you have to discontinue them for a week or two. Then we have a roster and from the roster we take them back again. In the case of these 21 employees, we are going into the matter especially as it comes from the hon. Member for Kotmale who has been co-operating with us in the Kotmale Reservoir Scheme. We are always ready to help him and accommodate him, and I can assure him that we will go into this matter of J. M. Jayasinghe of Harangala, Harnagalagama and see what could be done to him and the other people.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

The question from the Minister of Finance and Planning.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I will bring it to the notice of the Hon. Minister.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Hon. Deputy Minister of Foreign Affairs.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

There is one thing I wish to bring to the notice of the hon. Member. I myself had discussions on this matter with His Excellency the President who had assured me that he would look into the case of the surviving injured persons. The reply on the other matters, of course, you would get from the Hon. Minister of Foreign Affairs.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව පූ. භා. 11.43 ට, 1984 අගෝස්තු 23 වන බ්‍රහස්පතින්දා අ. භා. 3 වන තෙක් කල් ගියේ ය.*

*அதன்படி, மு. ப. 11.43 மணிக்கு பாராளுமன்றம், 1984 ஓகஸ்ட் 23, வியாழக்கிழமை பி. ப. 3 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 11.43 a.m. until 3.00 p.m. on Thursday, 23rd August, 1984.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### පී. කේ. ආරියපාල මහතා : නැවත සේවයෙහි පිහිටුවීම
### திரு. பி. கே. ஆரியபால : மீளச் சேவையிலமர்த்தல்
### MR. P. K. ARIYAPALA : RE-INSTATEMENT

177/84

ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා (ගාල්ල)
(கலாநிதி டபிள்யு. தஹநாயக்க — காலி)
(Dr. W. Dahanayake–Galle)

කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) 1984.4.19 දිනැති අංක 555/83 දරණ ප්‍රශ්ණයට දුන් පිළිතුරට යොමුව — පී. කේ. ආරියපාල මහතාට,

(i) වසර පහක නොකැළැල් සේවා කාලයක් ඇති හෙයින් ; හා

(ii) ඔහු වැඩ වර්ජකයකු නොවන බවට පිළිගෙන ඇති හෙයින් ;

ඔහු නැවත සේවයෙහි පිහිටුවන්නේද ?

(ආ) එසේ නොකරන්නේ නම්, ඒ මන්ද ?

கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) 555/83 ஆம் இலக்க 19.4.1984 ஆந் திகதிய வினாவுக்கான விடை தொடர்பாக, திரு. பி. கே. ஆரியபால,

(i) ஐந்தாண்டு களங்கமற்ற சேவையையுடையவராய் இருப்பதனாலும் ;

(ii) இவர் வேலைநிறுத்தத்தில் பங்கு கொள்ளவில்லை என்பது ஏற்றுக்கொள்ளப்பட்டிருப்பதனாலும்,

இவரை மீளச் சேவையிலமர்த்துவாரா ?

(ஆ) இல்லையேல், ஏன் ?

asked the Minister of Industries and Scientific Affairs :

(*a*) With reference to the answer to Question No. 555/83 of 19,04.84, will he re-instate Mr. P. K. Ariyapala, as–

(i) he had a record of five years unblemished service and,

(ii) it is admitted that he was not a striker ;

(*b*) If not, why ?

**සිරිල් මැතිව් මහතා (කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමා)**
**(திரு. சிறில் மத்திவ் — கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)**
**(Mr. Cyril Mathew–Minister of Industries & Scientific Affairs)**

(අ) නැත. ආරියපාල මහතාට අවු. 5 ක සේවා කාලයක් තිබූ බව සත්‍යයකි. 1980 ජූනි 25 සැනි දින සේවයට නොපැමිණීම නිසා ඔහුට එරෙහිව විනයානුකූලව ක්‍රියා කර නැත. ඊට පසු 1980 ජූලි 25 වැනි දින හදිසි අවස්ථා රෙගුලාසි යටතේ සංස්ථා සේවකයින්ගේ සියලුම නිවාඩු අවලංගු කළ අතර. 1980 ජූලි 25 වැනි දින ප. ව. 12.10 ට තම තනතුර අතහැර ගිය හෙයින්. ඔහු සේවය අතහැර ගියා සේ සලකන ලදී.

(ආ) පැන නොනගී.

සටහන.—1980 ජූනි මාසයේදී මෙම නිලධාරියාට එරෙහිව විනයානුකූලව කටයුතු කර නැත. ඊට පසුවද මෙම නිලධාරියා සේවයේ යෙදී ඇත. සිදුවී ඇත්තේ ඔහු පූර්ව අනුමැතිය නොමැතිව 1980 ජූලි 25 දින කාර්යාලයෙන් පිටව ගොස් ඇති අතර. එදින සිට රාජ්‍ය පරිපාලන අමාත්‍යංශ චක්‍රලේඛ අංක 2/9/771 (එච්) හා 1980. 07. 17 සහ අංක 2/9/771 (එච්) හා 80. 08. 22 අනුව ඔහු තම සේවය අතහැර ගියාසේ සලකා ඇත.

(*a*) No. It is true that Mr. Ariyapala had five years service. He was not dealt with disciplinarily for his absence on 25th June, 1980. Subsequently on 25th July, 1980, when all leave of Corporation employees was cancelled under Emergency Regulations, Mr. P. K. Ariyapala deserted his post on 25th July, 1980 at 12.10 p.m. and was deemed to have vacated his post.

(*b*) Does not arise.

*Note*:

The officer was not dealt with disciplinary action on 25th June, 1980. He was in service even after that. Wha happened was he left office without approval on 25th July, 1980 and from that date he was considered as having vacated his post in terms of Public Administration Circular No. 2/9/771(H) of 17.07.1980 and No. 2/9/771(H) of 22.08.1980.

### එම්. පී. ජී. උපාසක අප්පු මහතා, ප්‍රාගම රිය අනතුරින් මියගිය : වැන්දඹුවට වන්දි
### திரு. எம். பீ. ஜீ. உபசக அப்பு, மரண விபத்து : விதவைக்கு நஷ்டஈடு
### MR. M. P. G. UPASAKA APPU, FATAL ACCIDENT : COMPENSATION TO WIDOW

195/84

ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

ප්‍රවාහන කටයුතු පිළිබඳ ඇමතිතුමා සහ ගමනාගමන මණ්ඩල පිළිබඳ ඇමතිතුමා සහ පුද්ගලික බස් ප්‍රවාහනය පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) 1983.12.22 දින අංක 524/83 ප්‍රශ්නය සම්බන්ධයෙන්, වෛද්‍ය වාර්තාව ඇතුළුව ඉල්ලා තිබූ සියලුම ලේඛන ඉදිරිපත් කොට ඇති බව එතුමා දන්නේද ?

(ආ) වැන්දඹුව විසින් රුපි. 25,000 ඉල්ලා ඇති බව එතුමා දන්නේද ?

(ඇ) වැන්දඹුවට කොපමණ වන්දියක් ගෙවනු ලබන්නේද ?

போக்குவரத்து அமைச்சரும், போக்குவரத்துச் சபைகள் அமைச்சரும், தனியார் பஸ் போக்குவரத்து அமைச்சருமான வரைக் கேட்ட வினா :

(அ) 22.12.1983 ஆந் தேதியன்று 524/83 ஆம் இலக்க வினாவுக்களிக்கப்பட்ட விடையின் பிரகாரம், வைத்திய அறிக்கை உட்பட கேட்கப்பட்ட சகல ஆவணங்களும் அனுப்பப்பட்டுவிட்டன என்பதை அவர் அறிவாரா ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ஆ) இவ்விதவை ரூபா 25,000 கோரியுள்ளார் என்பதை அவர் அறிவாரா?

(இ) விதவைக்கு எவ்வளவு நஷ்டஈடு வழங்கப்படும்?

asked the Minister of Transport and Minister for Transport Boards and Minister for Private Omnibus Transport :

(*a*) With reference to the reply to question No. 524/83 of 22.12.1983, is he aware that all documents that were asked have been forwarded including the medical report ?

(*b*) Is he aware that the widow has claimed Rs. 25,000 ?

(*c*) How much compensation will be paid ?

**එම්. එච්. මොහොමඩ් මහතා (ප්‍රවාහන කටයුතු පිළිබඳ ඇමතිතුමා, ගමනාගමන මණ්ඩල පිළිබඳ ඇමතිතුමා සහ පුද්ගලික බස් ප්‍රවාහනය පිළිබඳ ඇමතිතුමා)**
**(ஜனாப் எம். எச். முஹம்மத் — போக்குவரத்து அமைச்சரும் போக்குவரத்துச் சபைகள் அமைச்சரும் தனியார் பஸ் போக்குவரத்து அமைச்சரும்)**
(Mr. M. H. Mohamed–Minister of Transport, Minister for Transport Boards and Minister for Private Omnibus Transport)

(අ) ඔව්.
මෙම ගෙවීම සම්බන්ධයෙන් වෛද්‍ය වාර්තාව අවශ්‍ය නොවන අතර, එය ඉදිරිපත් කර ද නැත. මරණ සහතිකය ඇතුළු අවශ්‍ය අනෙකුත් සහතික 84. 04. 23 වැනි දින ලූසිහාමි මහත්මිය විසින් ඉදිරිපත් කර ඇත.

(ආ) ඔව්.
1984. 02. 06 දින දරණ ලිපියෙන් ලූසිහාමි මහත්මිය මෙම ඉල්ලීම ඉදිරිපත් කර ඇත.

(ඇ) මියයන විට ස්වාමිපුරුෂයාගේ වයස අවුරුදු 60 කට වැඩි වූ හෙයින් මණ්ඩලයේ ක්‍රියා පිළිවෙල අනුව මෙම වැන්දඹුවට වන්දියක් ලැබීම සඳහා හිමිකම් නැත. එහෙත් කරුණාසහගත දීමනාවක් වශයෙන් රු. 2,500/—ක් ගෙවීමට නියමිතය. මේ සඳහා අත්සන් කර එවීමට ලූසිහාමි මහත්මිය වෙත යවා ඇති වවුචරය ඇය විසින් මෙතෙක් ආපසු එවා නොමැත.

(*a*) Yes. The medical certificate is not required and it has not been forwarded. Other documents required, including the death certificate, have been forwarded by Mrs. Lucihamy on 23.04.84.

(*b*) Yes. By her letter of 06.02.84 Mrs. Lucihamy has made this claim.

(*c*) According to the procedure followed by the Board, this widow is not entitled to any compensation as her husband was over 60 years of age at the time of his death. However, it has been decided to pay an ex-gratia payment of Rs. 2,500/. The voucher sent to her for signature and return has not been returned by her so far.

## යූ. ඩී. ජයනේරිස් මහතා : වැටුප්
## திரு. யு. டி. ஜயநேரிஸ் : சம்பளம்
## MR. U. D. JAYANERIS : SALARY

196/84

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා**
**(கலாநிதி டபிள்யு. தஹநாயக்க)**
(Dr. W. Dahanayake)

වනිතා කටයුතු හා ශික්ෂණ රෝහල් පිළබඳ ඇමතිතුමියගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) 84.03.09 වැනි දින අංක 488/83 ප්‍රශ්නයට දුන් පිළිතුර සහ යොමුව, යූ. ඩබ්ලිව්. ජයනේරිස් මහතාට තවමත් සහනයක් ලබා දී නොමැති බව එතුමා දන්නේද ;

(ආ) මේ කාරණය එතුමිය නිමාවකට පත් කරන්නේද ?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද ?

மாதர் அலுவல்கள், போதனா வைத்தியசாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 09.03.84 ஆந் தேதியன்று 488/83 ஆம் இலக்க வினாவுக்குத் தரப்பட்ட விடையின்படி, திரு. யு. டபிள்யு. ஜயநேரிஸுக்கு எவ்வித நிவாரணமும் இன்னும் வழங்கப்படவில்லை என்பதை அவர் அறிவாரா?

(ஆ) இவ்விஷயத்தில் அவர் இறுதி முடிவு எடுப்பாரா?

(இ) இல்லையேல், ஏன்?

asked the Minister of Women's Affairs and Teaching Hospitals :

(*a*) With reference to the reply to question No. 488/83 of 09.03.84, is he aware that no relief has been granted yet to Mr. U. W. Jayaneris ?

(*b*) Will she finalise this matter ?

(*c*) If not, why ?

**සුනේත්‍රා රණසිංහ මහත්මිය (නියෝජ්‍ය සෞඛ්‍ය ඇමතිතුමිය)**
**(திருமதி சுனேத்ரா றணசிங்ஹ — சுகாதாரப் பிரதி அமைச்சர்)**
(Mrs. Sunethra Ranasinghe–Deputy Minister of Health)

(අ) ඔව්.

(ආ) ඔව්.
1984. 08. 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අර්ධකාලීන කරණවෑමියන්ට පැයකට රු. 4 (මාසයකට රු. 500 ක් නො ඉක්මවන) ක මුදලක් ගෙවීමට බලය දෙමින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විමධ්‍යගත ඒකකයන්හි සහ විශේෂිත ව්‍යාපාරයන්හි ප්‍රධානීන්ටත් චක්‍ර ලේඛයක් මගින් උපදෙස් දී ඇත.

යූ. ඩබ්ලිව්. ජයනේරිස් මහතාට ද මෙම පදනම මත ගෙවනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

(*a*) Yes.

(*b*) Yes.
Circular instructions have already been sent to Heads of Decentralised Units and Specialised Campaigns of the Department of Health authorising the payment of Rs. 4/ per hour (not exceeding Rs. 500 p.m.) to part-time barbers with effect from 01.08.1984.
Mr. U. W. Jayaneries will also be paid on this basis.

(*c*) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

1984 අගෝස්තු 24 වන සිකුරාද

නොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි

குறிப்பு

அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு

*1984 ஓகஸ்ட் 24, வெள்ளிக்கிழமைக்குப் பிந்தாமற்*

கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD

**not later than**

**Friday 24th August 1984**

---

| | | |
|---|---|---|
| **Contents of Proceedings** | : | **From 10.00 a.m. to 11.43 a.m. on 10.08.1984** |
| **Final set of manuscripts received from Parliament** | : | **6.00 p.m. on 10.08.1984** |
| **Printed copies despatched** | : | **11.08.1984 afternoon** |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.*

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org